# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயல்திறன் அறிக்கை

# Annual Performance Report

# 2025




කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்.
Department of Technical Education &Training

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2025

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය: 215


| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| 01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය | 01 - 06 |
| 02 වන පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම | 07 - 14 |
| 03 වන පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය | 15 - 38 |
| 04 වන පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක | 39 |
| 05 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 40- 42 |
| 06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ | 43 - 45 |
| 07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව | 46 - 51 |

1 වන පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

### 1.1 හැඳින්වීම

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලිය විධිමත් පරිදි ආරම්භ වූයේ 1893 වර්ෂයේ දී මරදාන කාර්මික පාසල ස්ථාපනය කිරීමත් සමඟය.අනතුරුව ශ්‍රී ලංකා අධ්‍යාපන පනත යටතේ කාර්මික විද්‍යාල ජාලයක් දිවයින පුරා පිහිට වූ අතර කාර්මික අධ්‍යාපනයේ ප්‍රමිතිය උසස් කිරීමේ මූලික පරමාර්ථය ඇතිව ක්‍රියාත්මක වූ දෙවන කාර්මික අධ්‍යාපන ව්‍යාපෘතියේ නිර්දේශ යටතේ එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කාර්මික අධ්‍යාපන අංශය, 1994 වර්ෂයේදී කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ලෙස පරිවර්තනය කරන ලද අතර කාර්මික විද්‍යාල සියල්ලේ පරිපාලන කටයුතු මෙම දෙපාර්තමේන්තුව යටතට පත්කරන ලදී.

ඒ අනුව, වර්තමානයේ අධ්‍යාපන,උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා පිහිටුවා ඇති තාක්ෂණ විද්‍යාල 09 ක් හා කාර්මික විද්‍යාල 30ක් මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික පත්‍ර පාඨමාලා සියයකට වැඩි ප්‍රමාණයක් විවිධ කර්මාන්ත අංශ 18 ක් යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මධ්‍යයෙන් පවත්වනු ලැබේ. වාර්ෂිකව සිසුන් 25000කට වඩා වැඩි ප්‍රමාණයක් විවිධ කාර්මික හා වෘත්තීය පාඨමාලා සඳහා බඳවාගනු ලැබේ. දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපල වෙත තරුණ ප්‍රජාව යොමු කිරීමේ අරමුණින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3, 4 මට්ටමේ සහතික හා 5, 6 ඩිප්ලෝමා සහතික පිරිනමනු ලබන අතර වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා උපාධිය දක්වා ගමන් කිරීමටද අවස්ථාව සලසා ඇත. එසේම පෙර ඉගෙනුම් ඇගයීම ක්‍රමවේදය යටතේ විවිධ ක්ෂේත්‍ර වල ශ්‍රමිකයන්හට තම වෘත්තීය සුදුසුකම සඳහා RPL සහතික ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.

මෝටර් කාර්මික තාක්ෂණය, කෘෂිකර්ම නිෂ්පාදන හා ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය, ආහාර තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, මෙකාට්‍රොනික්ස් තාක්ෂණය, ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය, විදුලි සංදේශන තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය, වෙල්ඩින් තාක්ෂණය, නිෂ්පාදන තාක්ෂණය ආදී තාක්ෂණ පාඨමාලා මෙන්ම හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයේ පේස්ට්‍රි හා බේකරි ,ඉවුම් පිහුම් ආදී වෘත්තීය පාඨමාලාද ගණකාධිකරණය , ලේකම් පරිචය, ලඝුලේඛණය හා නාවික ප්‍රවාහන කළමණාකරනය ඇතුළු පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන්හි පවත්වාගෙන යන අතර තත්ත්ව සහතික පද්ධතියක් යටතේ අඛණ්ඩව පුහුණු ක්‍රමවේදය ඇගයීම් කර සියළු පාඨමාලා තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් ප්‍රතිනය කර ඇත. කාලීන රැකියා වෙළඳපල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නව රැකියා ඉලක්ක කරගත් පුහුණු පාඨමාලා හඳුන්වාදීම සඳහා වරින් වර විෂයමාලා සකස් කරනු ලබන අතර පවතින පාඨමාලා නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි අඛණ්ඩව යාවත්කාලීන කෙරේ.එසේම වරින් වර ක්‍රියාත්මක කරන ලද විදේශ ආධාර ව්‍යාපෘති හරහා හඳුනාගත් කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රවල පාඨමාලා යාවත්කාලීන කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම ගුරුවරුන්ගේ පුහුණු යාවත්කාලීන කිරීමද සිදුකර ඇත.

දිනෙන් දින විකාශනය වන ගෝලීය කාර්මික ක්ෂේත්‍රයන්ට ගැලපෙන පරිදි කාර්මික හා වෘත්තීය පාඨමාලා යාවත්කාලීන කර ජාතික මෙන්ම ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි මානව සම්පත සංවර්ධනය කිරීමට කාර්මික හා තාක්ෂණ විද්‍යාල හරහා පාඨමාලා ක්‍රියාත්මක වන අතර විදේශීය රැකියා ඉල්ලුම සහිත පාඨමාලා සඳහා තරුණ තරුණියන් හට පුහුණුව ලබා දීම හරහා පුහුණු ශ්‍රමිකයන් විදේශගතවීම සාපේක්ෂව වැඩි විදේශ විනිමය ප්‍රේශන පුමාණයක් මෙරටට ලැබේ.මේ වන විට සෑම වසරකම කාර්මික හා තාක්ෂණ විද්‍යාල හරහා කාර්මික හා වෘත්තීය පුහුණුව ලැබූවන් 2000 කට ආසන්න සංඛ්‍යාවක් විදේශ රැකියාගත වීම තුලින් මෙරට ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දීම මෙහිලා සඳහාන් කල හැකිවේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ජාත්‍යන්තරව උසස් පිළිගැනීමකින් යුත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමේ ප්‍රමුඛයා වීම.

**මෙහෙවර**

අපගේ සේවාලාභීන්ට උසස් තත්වයෙන් යුත් දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන ආයතනය ලෙස කටයුතු කිරීම.


**අරමුණු**

- පාසල් හැර යන තරුණ තරුණියන්ට සහ රැකියාවල නියුතු පුද්ගලයන්ට කාර්මික අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම.
- තාක්ෂණ හා කාර්මික අධ්‍යාපනය තුළින් උපාධි මට්ටමට ළඟා වීමට මාර්ගය නිර්මාණය කිරීම.
- රටේ ආර්ථික සංවර්ධනය සඳහා මානව ප්‍රාග්ධනය සැපයීම.
- ස්වයං රැකියා සහ කර්මාන්ත අංශයට මඟ පෙන්වන නිපුණතා ගොඩනැගීම.
- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන හා තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන්හට කාර්මික අධ්‍යාපන අවස්ථා සලසා දීම.

## 1.3 කාර්යයන්

- කාර්මික අධ්‍යාපනය හා ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මඟ පෙන්වීම, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.
- කාර්මික අධ්‍යාපනය සහ පුහුණු කිරීම වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය.
- කාර්මික අධ්‍යාපනය හා පුහුණු ක්‍රමය තුල අනුමත ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට අනුව පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ සමග ඒකාබද්ධ ක්‍රියාකාරී වැඩසටහන් සැකසීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.
- කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු සිදු කිරීම හා නව නිපැයුම් සඳහා අවකාශ සලසා දීම.

**1.4 දෙපාර්තමේන්තුවේ ආයතනික ව්‍යුහය**



## 1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති අංශයන්

1. පරිපාලන අංශය
2. අධ්‍යයන අංශය
3. පරීක්ෂණ සහ ඇගයීම් අංශය
4. වෘත්තීය මාර්ගෝපදේශන සහ අලෙවි අංශය
5. පර්යේෂණ සහ සංවර්ධන අංශය
6. තාක්ෂණික සහාය සේවා අංශය
7. සැලසුම් අංශය
8. යටිතල පහසුකම් සංවර්ධන අංශය
9. නඩත්තු අංශය
10. මූල්‍ය කළමනාකරණ අංශය
11. කළමනාකරණ තොරතුරු ඒකකය

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන ( ඇමුණුම 1)

| | | |
|---|---|---|
| තාක්ෂණ විද්‍යාල | - | 09 |
| කාර්මික විද්‍යාල | - | 30 |

## 1.7 දෙපාර්තමේන්තුවට ලැබෙන අරමුදල්

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේ දී විවිධ මූලාශ්‍රවලින් පහත පරිදි අරමුදල් වෙන් කරන ලදී.


| | අරමුදල් මූලාශ්‍රය | 2025 සඳහා වෙන් කළ ප්‍රතිපාදනය (රු. මී) | 2025.12.31 දිනට වියදම | ප්‍රගතිය % | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය | භෞතික |
| ඒකාබද්ධ අරමුදල | | | | | |
| 1. | ප්‍රාග්ධන | 235.578 | 231.758 | 98 | 95 |
| 2. | පුනරාවර්තන | 3187.319 | 2839.266 | 89 | 100 |
| අයවැය යෝජනා | | | | | |
| 3. | මරදාන තාක්ෂණ විද්‍යාලය නවීකරණය කිරීම ( කුලසිංහ ගොඩනැගිල්ල) | 30.00 | 26.34 | 88 | 60 |
| | මාතර කාර්මික විද්‍යාලය නවීකරණය කිරීම | 20.00 | 7.49 | 38 | 85 |
| විදේශීය අරමුදල් | | | | | |
| 4.1 | . | 34.083 | 34.083 | 100 | 100 |
| | එකතුව | **3506.98** | **3138.937** | **95** | **92** |

### 1.7.1 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

| ව්‍යාපෘතියේ නම | අරමුදල් ලබා දෙන නියෝජිත ආයතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල (මිලියන) | ව්‍යාපෘති කාල සීමාව | ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති සංරචක |
|---|---|---|---|---|
| තෝරාගත් කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල Solar Technology සහ Hospitality පාඨමාලා ආරම්භ කිරීම සහ වැඩිදියුණු කිරීම. කුරුණෑගල, අනුරාධපුරය, තාක්ෂණ විද්‍යාලත් මඩකලපුව, කළුතර, හෝමාගම , නුවර එළිය, ආනමඩු, වරකාපොළ කාර්මික විද්‍යාල) | GIZ VTSL ව්‍යාපෘතිය යටතේ | 34.083 | 2025 | ➢ විදුලි ක්ෂේත්‍රයේ පුහුණුකරුවන්ගේ ධාරිතාව ගොඩනැගීම.<br>➢ රැකියාගත පුහුණුව ප්‍රවර්ධනය කිරීම.<br>➢ Solar Photovotic Technician හා Renewable Energy පාඨමාලා සඳහා පුහුණු උපකරණ හා අමුද්‍රව්‍ය සැපයීම.<br>➢ හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයේ නව පාඨමාලා ආරම්භ කිරීම<br>➢ පවතින වැඩහල් ප්‍රතිනිර්මාණය කිරීම.<br>➢ හෝමාගම, වරකාපොළ ,නුවරඑළිය , හා ආණමඩුව පාඨමාලා යාවත්කාලීන කිරීම. |

# තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාලවල පිහිටීම

| පළාත | තාක්ෂණ/කාර්මික විද්‍යාලය |
|---|---|
| බස්නාහිර | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය කොළඹ (මරදාන) |
| | කාර්මික විද්‍යාලය - ගම්පහ |
| | කාර්මික විද්‍යාලය - හෝමාගම |
| | කාර්මික විද්‍යාලය - කළුතර |
| | කාර්මික විද්‍යාලය - රත්මලාන |
| දකුණ | තාක්ෂණ විද්‍යාලය - ගාල්ල |
| | කාර්මික විද්‍යාලය - බලපිටිය |
| | කාර්මික විද්‍යාලය - බෙලිඅත්ත |
| | කාර්මික විද්‍යාලය - මාතර |
| | කාර්මික විද්‍යාලය - වීරවිල |
| සබරගමුව | තාක්ෂණ විද්‍යාලය - රත්නපුර |
| | කාර්මික විද්‍යාලය - ඇඹිලිපිටිය |
| | කාර්මික විද්‍යාලය - කෑගල්ල |
| | කාර්මික විද්‍යාලය - වරකාපොල |
| ඌව | තාක්ෂණ විද්‍යාලය - බදුල්ල |
| | කාර්මික විද්‍යාලය - බණ්ඩාරවෙල |
| | කාර්මික විද්‍යාලය - මැදගම |
| | කාර්මික විද්‍යාලය - මොණරාගල |
| නැගෙනහිර | තාක්ෂණ විද්‍යාලය - අම්පාර |
| | කාර්මික විද්‍යාලය - අක්කරපත්තුව |
| | කාර්මික විද්‍යාලය - මඩකලපුව |
| | කාර්මික විද්‍යාලය - දෙහිඅත්තකණ්ඩිය |
| | කාර්මික විද්‍යාලය - සමන්තුරේ |
| | කාර්මික විද්‍යාලය - ත්‍රිකුණාමලය |
| මධ්‍යම | තාක්ෂණ විද්‍යාලය - මහනුවර |
| | කාර්මික විද්‍යාලය - දඹුල්ල |
| | කාර්මික විද්‍යාලය - හසලක |
| | කාර්මික විද්‍යාලය - මාතලේ |
| | කාර්මික විද්‍යාලය - නුවරඑළිය |
| | කාර්මික විද්‍යාලය - පාතදුම්බර |
| උතුරු මැද | තාක්ෂණ විද්‍යාලය - අනුරාධපුර |
| | කාර්මික විද්‍යාලය - ප්ලොන්නරුව |
| වයඹ | තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල |
| | කාර්මික විද්‍යාලය - ආණමඩුව |
| | කාර්මික විද්‍යාලය - කුලියාපිටිය |
| | කාර්මිකවිද්‍යාලය-වාරියපොල |
| උතුරු | තාක්ෂණ විද්‍යාලය - යාපනය |
| | කාර්මික විද්‍යාලය - වවුනියාව |
| | කාර්මික විද්‍යාලය - මන්නාරම |



2 වන පරිච්ඡේදය

# ප්‍රගතිය සහ අනාගත දැක්ම

## 2.1 ප්‍රගතිය සහ ජයග්‍රහණ

කර්මාන්ත අංශයේ ක්ෂේත්‍ර 18 ක් යටතේ පවත්වන ලද පාඨමාලා 166 ක් සඳහා තාක්ෂණ විද්‍යාල 09 සහ කාර්මික විද්‍යාල 30 සඳහා 2025 දෙසැම්බර් 31 වන විට සිසුන් 31,942 බඳවාගෙන ඇත. පෙර වසරවල බඳවාගත් සිසුන් 5,556 හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ බඳවාගත් සිසුන් 1,381 සමඟ 2025 වර්ෂයේදී විද්‍යාල 39 හි සිසුන් 31,942 පුහුණුව ලබා ඇත

| අංකය | ක්ෂේත්‍රයේ නම | **2025** සිසුන් බඳවා ගැනීම් | පෙර වසරවල සිසුන් බඳවා ගැනීම් | **13** වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ බඳවා ගැනීම් | මුළු ශිෂ්‍ය බඳවා ගැනීම් |
|---|---|---|---|---|---|
| 1 | කෘෂිකාර්මික, වැවිලි සහ පශු සම්පත් | 1823 | 624 | 65 | 2447 |
| 2 | මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව | 5486 | 1436 | 528 | 6922 |
| 3 | ගොඩනැගිලි ඉදිකිරීම | 3340 | 794 | 86 | 4134 |
| 4 | විදුලි, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ | 2627 | 1300 | 91 | 3927 |
| 5 | මූල්‍ය බැංකුකරණය සහ කළමනාකරණය | 1127 | 135 | | 1262 |
| 6 | ආහාර තාක්ෂණය | 162 | 141 | | 303 |
| 7 | මැණික් සහ ස්වර්ණාභරණ | 49 | 10 | | 59 |
| 8 | හෝටල් සහ සංචාරක | 2129 | 238 | 230 | 2367 |
| 9 | තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය තාක්ෂණය | 3949 | 618 | 172 | 4567 |
| 10 | භාෂා | 1703 | 9 | | 1712 |
| 11 | සම් භාණ්ඩ සහ පාවහන් | 52 | | | 52 |
| 12 | මෙකාට්‍රොනික් තාක්ෂණය | 217 | 142 | | 359 |
| 13 | වෛද්‍ය සහ සෞඛ්‍ය විද්‍යාව | 239 | | 79 | 239 |
| 14 | ලෝහ සහ සැහැල්ලු ඉංජිනේරු විද්‍යාව | 1482 | 96 | 85 | 1578 |
| 15 | කාර්යාල කළමනාකරණය | 555 | | | 555 |
| 16 | ශීතකරණ සහ වායු සමීකරණය | 916 | 13 | 38 | 929 |
| 17 | පුහුණුකරුවන් පුහුණු කිරීම | 52 | | 1 | 52 |
| 18 | රෙදිපිළි සහ ඇඟලුම් | 367 | | | 367 |
| 19 | දැව කර්මාන්තය | 111 | | **6** | 111 |
| | **මුළු එකතුව** | **26386** | **5556** | **1381** | **31942** |

2025 වර්ෂයේදී පුහුණුව ලැබූ සිසුන්ගෙන් 35 % ක ප්‍රමාණයක් කාන්තාවන් වන අතර කාර්මික පාඨමාලා සඳහා කාන්තා නැඹුරුව අඩුමට්ටමක පැවතියද තොරතුරු තාක්ෂණය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පාඨමාලා, ආහාර තාක්ෂණය, හෝටල් පාඨමාලා, සම්භාණ්ඩ,මැණික් හා

ස්වර්ණාභරණ, ටේලරින්, බතික්, මූල්‍ය බැංකුකරණය සහ කාර්යාල කළමනාකරණය, භාෂා වැනි පාඨමාලා සඳහා ඉහල කාන්තා සහභාගීත්වයක් දක්නට ලැබේ.

| පාඨමාලා | ශිෂ්‍ය සංඛ්‍යාව | | | කාන්තා සහභාගීත්වය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | කාන්තා | පුරුෂ | එකතුව | |
| ඉංජිනේරු ක්ෂේත්‍රය ආශ්‍රිත පාඨමාලා | 159 | 10,591 | 10,750 | 8% |
| අනෙකුත් කර්මාන්ත ආශ්‍රිත පාඨමාලා | 3409 | 4867 | 8276 | 54% |
| කර්මාන්ත ආශ්‍රිත නොවන පාඨමාලා | 4964 | 1614 | 3950 | 68% |
| **මුළු එකතුව** | **8532** | **17,072** | **22,976** | **32%** |

- 2025 වර්ෂයේ දී දේශීය හා විදේශීය රැකියා වෙළඳපළ ඉලක්ක කරගත් පාඨමාලා ලෙස වෙල්ඩින් ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා සිසුන් 940ක්, පේස්ට්‍රි බේකරි හා කුකරි පාඨමාලා සඳහා සිසුන් 789ක්, ක්ෂණික සේවා අවන්හල් පාඨමාලා සඳහා 546ක් කෘෂිකාර්මික පාඨමාලා සඳහා සිසුන් 1662ක්, ඇලුමීනියම් පිළිසකරකරණය පාඨමාලාව සඳහා සිසුන් 624, ඉලෙක්ට්‍රිකල් ක්ෂේත්‍රයේ සිසුන් 881ක්, ශීතකරන හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ සිසුන් 929ක්, මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ සිසුන් 940ක්, මැෂින් පාඨමාලා සඳහා සිසුන් 401ක්, ජලනල පාඨමාලා සඳහා සිසුන් 359ක් හා හෙද හා සත්කාරක සේවා සඳහා සිසුන් 102ක් පුහුණු කර ඇත.

- 2025 වර්ෂයේදී නව පාඨමාලා ලෙස කාර්මික හා තාක්ෂණ විද්‍යාල මට්ටමින් Industrial Sewing Mechanic (NVQ 4), Bespoke Design Tailoring (NVQ 5), Pre-School Teaching (NVQ 05), Renewable Energy Technology (NVQ 5), Solar Photovoltaic Technician (NVQ 4), Food & Beverage Assistant (NVQ 4), Batik Artist (NVQ 4), Nurse Assistant (NVQ 4), Early Childhood Development (NVQ 4) සහ Tailoring (NVQ 4) යන පාඨමාලා ආරම්භ කරන ලදි.

- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ කාර්මික හා තාක්ෂණ විද්‍යාල මගින් තාක්ෂණ හා වෘත්තීය විෂය ධාරාව හදාරන සිසුන් 1381 ක් සඳහා ක්ෂේත්‍ර 11 ක් යටතේ පුහුණු පහසුකම් සපයා පුහුණු කටයුතු සිදු කරනු ලැබේ. එම සිසුන් NVQ 4 මට්ටමේ සහතිකය ලබාගැනීම සඳහා සුදුසුකම් ලබනු ඇත.

- 2025 වර්ෂයේදී තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාල මගින් වෙල්ඩින්, ජලනල තාක්ෂණය, ඇලුමිනියම් පිළිසකරකරණය, මෝටර්රථ තාක්ෂණය, විදුලි, වඩු කාර්මික, පෙදරේරු කාර්මික, තොරතුරු තාක්ෂණය, කළමණාකරණ, වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යාව සහ ශීතකරණ හා වායුසමීකරණ යන ක්ෂේත්‍ර සඳහා පෙර ඉගෙනුම් ඇගයීම (RPL) සහතික පත්‍ර 268ක් නිකුත් කර ඇත. මීට අමතරව ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය මගින් සිදු කරනු ලබන පෙර ඉගෙනුම් ඇගයීම (RPL) සඳහා අවශ්‍ය වැඩහල් පහසුකම් තාක්ෂණ හා කාර්මික විද්‍යාල මගින් සපයා ඇත.

- 2025 වර්ෂයේදී තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39හරහා NVQ 3,4 මට්ටමේ සහතිකපත්‍ර 13,265 NVQ 5,6 මට්ටමේ සහතිකපත්‍ර 3274ද දෙපාර්තමේන්තු සහතිකපත්‍ර 5635 ද ලෙස මුළු සහතික පත්‍ර 22,174ක් නිකුත් කර ඇත.

- Gamma Pizza Kraft Lanka (Pvt) Ltd. ආයතනය සමග ඇති කරගත් අවබෝධතා ගිවිසුමට අනුව ක්‍රියාත්මක වන සමාජ සත්කාරක ව්‍යාපෘතිය යටතේ මේ වන විට තාක්ෂණ හා කාර්මික විද්‍යාල 13ක ක්ෂණික සේවා අවන්හල් සහායක (Quick Service Restaurant, QSR NVQ 4) මට්ටමේ පාඨමාලා ආරම්භ කිරීම සඳහා අංග සම්පූර්ණ පුහුණු ඒකක ස්ථාපනය කිරීම Pizza Gamma

ආයතනය මගින් සිදු කර ඇති අතර එක් පුහුණු ඒකකයක් වෙනුවෙන් රුපියල් මිලියන 7ක මුදලක් වැය කර ඇත. මේ වනවිට ක්ෂණික සේවා අවන්හල් පාඨමාලාව කුලියාපිටිය,අනුරාධපුරය, කුරුණෑගල, මහනුවර, නුවරඑළිය, මාතර, කළුතර, දඹුල්ල, මඩකලපුව, ත්‍රිකුණාමලය, ගාල්ල, රත්නපුර හා හෝමාගම යන කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල ක්‍රියාත්මක කරනු ලබන අතර 2025 වර්ෂයේදී සිසුන් 558 දෙනෙකු පුහුණුව ලබමින් සිටින අතර පුහුණුව අවසන් කළ සිසුන් 541 පාඨමාලාව සම්පූර්ණ කර ඇති අතර ,108 පමණ ක්ෂණික සේවා අවන්හල් ජාලයේ රැකියා ගත වී ඇත

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව පෞද්ගලික අංශය හා ඒකාබද්ධව කාර්මික හා වෘත්තීය පාඨමාලා ප්‍රවර්ධනය, වැඩහල් යාවත්කාලීන කිරීම, රැකියා අවස්ථානය ජනනය හා RPL ක්‍රමවේදය හරහා වෘත්තීය සහතික ලබාදීම අරමුණු කරගෙන Pizza Gamma Kraft pvt (Ltd) Art of Living Organization , Browns Group Industries (Pvt) Ltd , L.H Construction Suleco (Pvt) Ltd , යන සමාගම් සමඟ 2024 වර්ෂයේදී එළඹුන අතර, Hemas Manufacturing (Pvt)Ltd ,Alumex Company හා Perera and Sons Bakers (Pvt)Ltd යන සමාගම් සමග අවබෝධතා ගිවිසුම් වලට 2025 වර්ෂයේදී එළඹුනි.

- බන්ධනාගාර රැඳවියන් වෘත්තීය පුහුණුවට යොමු කර වෘත්තීය සහතිකයක් ලබා දී සමාජගත කිරීම අරමුණු කරගනිමින් කෑගල්ල කාර්මික විද්‍යාලය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, මේ යටතේ හඳුනාගත් වෘත්තීය ක්ෂේත්‍ර සඳහා රැඳවියන් වෙනුවෙන් පුහුණු පාඨමාලා පැවැත්වීමට සැලසුම් කර ඇත.

- GIZ VTSL II ව්‍යාපෘතිය යටතේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා රුපියල් මිලියන 34.50 ක මූල්‍ය ප්‍රදානයක් ලබා දී ඇති අතර, මෙම අරමුදල් මගින් කළුතර, මඩකලපුව, හා අනුරාධපුර යන කාර්මික හා තාක්ෂණ විද්‍යාල වල Solar Photovoltaic Technician NVQ 4 මට්ටමේ පාඨමාලාව අලුතෙන් ආරම්භ කිරීම විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම හා පුහුණු උපකරණ මිලදී ගැනීම අවසන් කර හා දැනට පාඨමාලාව පවත්වාගෙනයනු ලබන වරකාපොල,හෝමාගම, නුවරඑළිය, ආණමඩුව හා කුරුණෑගල යන විද්‍යාල සඳහා පුහුණු උපකරණ සපයන ලදී., මහනුවර තාක්ෂණ විද්‍යාලයේ සත්කාරක ක්ෂේත්‍රයේ (Hospitality Sector Courses) නව පාඨමාලා ආරම්භ කිරීම සඳහා පුහුණු පහසුකම් සැපයීමටත් මරදාන තාක්ෂණ විද්‍යාලයේ බේකරි හා පේස්ට්‍රි පාඨමාලාව ආරම්භ කිරීම සඳහා පුහුණු පහසුකම් හා පුහුණු උපකරණ ලබා දෙන ලදී. ඒ සඳහා වැයවූ මුදල රුපියල් මිලියන 34.50 කි.

- GIZ VTSL ව්‍යාපෘතිය හරහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් (Master Trainer) අදියර කීපයක් යටතේ පවත්වන ලද අතර මේ සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් පුහුණුකරුවන් අට දෙනකු සඳහා පුහුණුව ලබා දී ඇත.
- Art of Living සංවිධානය හා දෙපාර්තමේන්තුව අතර ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව විදුලි ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ සති දෙකක පුහුණු වැඩසටහනක් ඉන්දියාවේ බැංග්ලෝර්හි Art of Living පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර, මේ සඳහා තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල විදුලි ක්ෂේත්‍රයේ උපදේශකවරුන් හා ශිල්ප ප්‍රර්ශකවරුන් 20 දෙනෙකු පමණ සහභාගි විය. මෙම පුහුණු වැඩසටහන GIZ හා Schneider Electrical Company මූල්‍ය සහයෝගීතාවය මත සම්බන්ධීකරණය සිදු විය.

- අධිවේගී මහණ මැෂින් අළුත්වැඩියා කිරීමේ (Industrial Sewing Machine Mechanic) පාඨමාලාව දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලයේදී ආරම්භ කල අතර මෙම පාඨමාලාව සඳහා අවශ්‍ය වන අධිවේගී හා පරිගණකගත මැෂින්වලින් සමන්විත වැඩහල් පහසුකම් හා පුහුණු උපකරණ දයාරත්න ඇපරල් ආයතනයේ සමාජ සත්කාරක ව්‍යාපෘතියක් හරහා නොමිලේ ප්‍රදානය කරන ලදි. මේ වන විට සිසුන් 29 දෙනෙකු පුහුණු කටයුතු සිදු කරන ලදී.

- 2025 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 වල යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 64.435ක ප්‍රතිපාදන වෙන් වූ අතර වඩාත් අත්‍යාවශ්‍ය ප්‍රමුඛතාගත ව්‍යාපෘති 45 ක වැඩ අවසන් කර ව්‍යාපෘති 7 වැඩ ක්‍රියකාත්මක තත්වයේ පැවති අතර එම ව්‍යාපෘති අවිඡේද වැඩ ලෙස 2026 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට තීරණය කරන ලදී කාර්මික හා තාක්ෂණ විද්‍යාල වල ගොඩනැගිලි, වැඩහල්,පන්ති කාමර, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම හා නවීකරණ උදෙසා මිලියන 63.685 කර ඇත.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල වැඩහල් සහ විද්‍යාගාර සඳහා යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම සඳහා රුපියල් මිලියන 115 වෙන් කරන ලදී එසේ වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් මාතර, බලපිටිය , දඹුල්ල ,ගම්පහ යන කාර්මික විද්‍යාල සහ අම්පාර , රත්නපුර තාක්ෂණ විද්‍යාල සඳහා බේකරි සහ කුකරි පාඨමාලාව වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගත් අතර, දඹුල්ල , කෑගල්ල, වරකාපොළ සහ පොළොන්නරුව යන කාර්මික විද්‍යාල වල සත්කාරක සේවා පාඨමාලාව සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම මෙන්ම තෝරාගත් විද්‍යාල සඳහා පරිසණක යන්ත්‍ර 112 මිලිදී ගැනීම සිදුකරන ලදී ඒ සඳහා රුපියල් මිලියන 113 වැය කරන ලදී.

- නුවරඑළිය කාර්මික විද්‍යාලයේ පුහුණු ධාරිතාවය ඉහල නැංවීම සඳහා පන්ති කාමර හා වැඩහල් පහසුකම් වලින් සම්න්විත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භක කටයුතු සිදුකරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මූලික සැලසුම් කටයුතු වෙනුවෙන් රු මිලියන 10 ක ප්‍රතිපාදන 2025 වර්ෂයේ අයවැය මගින් වෙන්වී තිබූ අතර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කල අතර ගොඩනැගිලි සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමේ මූලික අදියර වෙනුවෙන් රුපියල් මිලියන 10ක මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කරන ලදී.

- අයවැය යෝජනා යටතේ නවීකරණය කරනු ලබන මරදාන තාක්ෂණ විද්‍යාලය පස් මහල් කුලසිංහ ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු සහ මාතර කාර්මික විද්‍යාලයේ නවීකරණ කටයුතු සඳහා රුපියල් මිලියන 25 ක් වෙන්වූ අතර එම කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රමදායකත්ව යටතේ සිදුකරන ලදී . සිව්වන සහ තුන්වන මහලේ පන්ති කාමර, වැඩහල් සහ සනිපාරක්ෂණ පහසුකම් නවීකරණය 2025 දෙසැම්බර් වන විට 75% වැඩ අවසන් කර ඇති අතර මාතර කාර්මික විද්‍යාලයේ නවීකරණ කටයුතු 85% අවසන් කර ඇත. 2025 අයවැය ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 50 ක වලින් මිලියන 24.65 වැය කර ඇත.

- “Clean Sri Lanka” ජාතික වැඩසටහනට සමගාමීව වෘත්තීය අධ්‍යාපන ආයතනවල සංවිධිතබව පවත්වා ගැනීමේ හා වැඩිදියුණු කිරීමේ අරමුණින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රම මෙහෙයුම වැඩසටහන 2025 ජුලි හතර වන දින දිවයින පුරා පිහිටි වෘත්තීය අධ්‍යාපන ආයතන කේන්ද්‍ර කර ගනිමින් පැවැත් වූ අතර එහි ප්‍රධාන ජාතික උත්සවය ගම්පහ කාර්මික විද්‍යාල පරිශ්‍රයේදී දී ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මීට සමගාමීව සියලුම තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල ශ්‍රම මෙහෙයුමට අදාළව ගුරු ශිෂ්‍ය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා ආදි ශිෂ්‍ය හා ප්‍රජාවද එක් කරගනිමින් විද්‍යාලවල ඉගෙනුම් පරිසරය වැඩි දියුණු කර වඩාත් භෞතික ආකර්ශනීය පරිසරයක් හා සමාජීය හා ආකල්පමය දියුණුවක් ඇති කිරීමට අදාළව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී .

- ක්ලීන් ශ්‍රී ලංකා ජාතික වැඩසටහනට සමගාමීව තරුණ ප්‍රජාවේ ආකල්පමය සංවර්ධනය හා මානව ගුණාංග වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන වරකාපොල පසන්නවිත්ත ස්වාමීන්වහන්සේගේ මෙහෙයවීමෙන් කාර්මික හා තාක්ෂණ විද්‍යාල සියල්ලම ආවරණය වන පරිදි එක් දින ආකල්ප සංවර්ධන වැඩසටහන් මාලාවක් පවත්වන ලදි. ගුරු ශිෂ්‍ය කාර්යමණ්ඩල සාමාජිකයින් සියල්ල සක්‍රියව දායක කරගෙන ගරුතර ස්වාමීන් වහන්සේ විසින් ස්වේච්ඡාවෙන් මෙම වැඩසටහන් මාලාව පවත්වන ලදි.

- වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 549 ක් තරුණ ප්‍රජාව, දෙමාපියන්, පාසැල් ළමුන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිළධාරීන් ඇතුළුව පුද්ගලයන් 26,082ක් සඳහා පවත්වා ඇති අතර වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුවට අදාලව ප්‍රදර්ශණ 05ක් සඳහා සහභාගී වී ඇත.

- නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ 2025 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා කාර්මික හා තාක්ෂණ විද්‍යාල වල පාඨමාලා හදාරන සිසුන 4763 ක් සඳහා රු.මිලියන 248 ක් වටිනා ශිෂ්‍යාධාර ප්‍රදානය කර ඇත.

- නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය ඉහළ නැංවීම සඳහා ප්‍රධාන කාර්යාලය,තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල අධ්‍යක්ෂ වරුන්, විදුහල්පති වරුන්, උපදේශකවරුන්, ශිල්පප්‍රදර්ශකවරුන් හා කාර්යමණ්ඩල නිළධාරීන් 760 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 17ක් පවත්වා ඇත.

- රාජ්‍ය ආයතන වලින් ලබා ගන්නා සේවාවන් සඳහා ගෙවීම් කිරීමේ ක්‍රමවේදය කඩිනම් කිරීමේ ආරම්භයක් ලෙස ''Gov Pay "යෙදවුම හරහා විභාග ගාස්තු , ඩිප්ලෝමා සහතික ලබා ගැනීම වෙනුවෙන් ලියාපදිංචි ගාස්තු ආදිය ගෙවීම් විදියට් මාර්ගගත යෙදවුම හරහා සිදු කරමින් ඒ සඳහා ප්‍රවේශ වූ මුල්ම රාජ්‍ය ආයතන අතරට එක්වීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව රිදී සම්මානයකින් හා සහතිකයින් ඇගයීමට ලක් විය.

## 2.2 2026 වර්ෂයේ ඉලක්ක

- 2026 වර්ෂය සඳහා තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39ක් හරහා කර්මාන්ත ක්ෂේත්‍ර 18ක් යටතේ කාර්මික හා වෘත්තීය පාඨමාලා 200 ක් සඳහා සිසුන් 29000ක් පමණ බඳවාගෙන පුහුණු කිරීමට සැලසුම් කර ඇත. මේ යටතේ NVQ 3/4 පාඨමාලා 133ක්ද NVQ 5/6 පාඨමාලා 67 ක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර සහතික පත්‍ර පාඨමාලා 16 ද ඊට අමතරව කෙටිකාලීන , විශේෂ පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

- විවිධ අධ්‍යාපන මට්ටම්වල සිටින පුද්ගලයන් හට වෘත්තීය හා කාර්මික අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමත් වර්තමාන රැකියා වෙළඳපළට සරිලන කර්මාන්ත ක්ෂේත්‍රවල පාඨමාලා හා ප්‍රදේශ ආශ්‍රිත ඉල්ලුමට සරිලන පාඨමාලා ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් මෝටර් රථ අලුත් වැඩියාව හා නඩත්තුව ඉදිකිරීම් ක්ෂේත්‍රය, විදුලි හා ඉලෙක්ට්‍රොනික්, මෙකාට්‍රොනික්, විදුලි සංදේශ, පරිගණක හා තොරතුරු තාක්ෂණ,වෙල්ඩින් හා ලුහු ඉංජිනේරු, ඇලුමිනියම් පිළිසකරකරණය, යන්ත්‍රණය, හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය, ඇඟලුම්, වෛද්‍ය හා සත්කාරක සේවා, ලොජිස්ටික්, කාර්යාල කළමනාකරණය ආදී පුළුල් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පාඨමාලා පැවැත්වීමට සැලසුම් කර ඇත.

- ශ්‍රී ලංකා රජය ගෙනයන ආර්ථික ප්‍රතිපත්ති මත දිගුකාලීනව ආර්ථික සංවර්ධනයට උර දීම සඳහා නිපුණතාවයෙන් හෙබි තරුණ ප්‍රජාව, කුසලතා වලින් සන්නද්ධ කිරීමේ හැකියාව අත්‍යවශ්‍ය වන අතර අප රට එහි මානව ප්‍රාග්ධන සංවර්ධනයේ තීරණාත්මක සන්ධිස්ථානයක සිටී. ඒ අනුව පවත්නා නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශණයේ දැක්වෙන පරිදි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව වෘත්තීය අධ්‍යාපනය නගා සිටුවීම සඳහා 2026 වාර්ෂික අයවැයවැයෙන් වැඩි ප්‍රතිශතයක් වෙන්කර ඇත. ඒ අනුව කාර්මික හා තාක්ෂණ විද්‍යාල වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර ඇත. එම ව්‍යාපෘතිය 2026-2028 යන කාල රාමුව තුල නිම කිරීමට සැලසුම් කර ඇති අතර 2026 වර්ෂයත තුල විද්‍යාල 10 ක ප්‍රතිසංස්කරණය කටයුතු සිදුකිරීමට සැලසුම් කර ඇති අතර ඒ අනුව ප්‍රමුඛතාවය මත තෝරාගත් ගොඩනැගිල්ලක් සහ එම ගොඩනැගිල්ලය අයත් පන්ති කාමර , වැඩහල් සහ විද්‍යාගාර ප්‍රතිසංස්කරණය සහ විද්‍යාලයට පිවිසුම සහ පිවිසුම් මාර්ගය සහ අභ්‍යන්තර මාර්ග පද්ධති පිළිසකර කිරීමත් සියළුම විද්‍යාල වල පොදු නාම පුවරුවක් සකස් කිරීම මේ සඳහා ඇස්මේන්තු මුදල රුපියල් මිලියන 605.50 සහ වැඩහල් වැඩි දියුණු කිරීමට උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 690.69 ක මුදලක් වෙන් කර ඇති අතර මුළු යෝජිත ඇස්මේන්තු මුදල 1296.19 වේ.

| **ක්‍රියාකාරකම** | **යෝජිත ඇස්තමේන්තු මුදල (රු.මි.) 2026** |
|---|---|
| යටිතල පහසුකම් සංවර්ධනය (පළමු අදියර)<br>(විද්‍යාල 10 ක මරදාන, අම්පාර, බදුල්ල, ගාල්ල, යාපනය, කුරුණෑගල, කළුතර, වවුනියාව, කැගල්ල, සහ වරකාපොළ) | 605.50 |
| වැඩහල් වැඩිදියුණු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම (පළමු අදියර) | 690.69 |
| **එකතුව** | **1296.19** |

- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනය වැඩසටහන යටතේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රවලට යොමු වන සිසුන් සඳහා තාක්ෂණ හා කාර්මික විද්‍යාල හරහා පුහුණු පහසුකම් හා ප්‍රායෝගික දැනුම ලබාදීමත් NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පුහුණු පහසුකම් ලබා දීමටත් සැලසුම් කර ඇත.

- 2023 හා 2024 අධ්‍යයන වර්ෂවල NVQ 5 හා 6 ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පාඨමාලා සාර්ථකව නිමකළ සිසුන් 2500ට ප්‍රමාණයක් සඳහා වාර්ෂික ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2026 ජනවාරි 27 හා 28 දින පැවැත්වීමට සැලසුම් කර ඇත.

- 2026 වර්ෂයේදී කාර්මික හා වෘත්තීය පාඨමාලා සම්පූර්ණ කරනු ලබන සිසුන් සඳහා NVQ 5 හා 6 ඩිප්ලෝමා සහතික පත්‍ර 3,000ක්, NVQ 3 / 4 සහතික පත්‍ර 14,000ක්, RPL සහතික පත්‍ර 800ක් හා දෙපාර්තමේන්තු සහතික පත්‍ර 12,000 ලෙස මුළු සහතික පත්‍ර 29,800ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

- හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයේ පාඨමාලා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දේශීය අවන්හල් ජාලයේ ප්‍රමුඛ සන්නාමයක් වන Perera & Sons පෞද්ගලික සමාගමේ සමාජ සත්කාරක ව්‍යාපෘතියක් ලෙස මාතර කාර්මික විද්‍යාලයේ බේකරි හා පේස්ට්‍රි පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම හා පුහුණුලාභීන් රැකියාගත කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීමට සැලසුම් කර ඇත.

- GIZ VTSL Phase II ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කරන ලද Solar Photovoltaic Technician NVQ 4 වැඩහල් උපකරණ පහසුකම් උපයෝගී කරගනිමින් කළුතර, අනුරාධපුර හා මඩකලපුව යන විද්‍යාලවල නව පාඨමාලා ආරම්භ කිරීමටත් මහනුවර තාක්ෂණ විද්‍යාලයේ සත්කාරක සේවා පාඨමාලා ලෙස Room Attendant, Front Office හා Steward Assistant පාඨමාලා ආරම්භ කිරීමටත් මරදාන තාක්ෂණ විද්‍යාලයේ බේකරි හා පේස්ට්‍රි පාඨමාලාව 2026 වර්ෂයේදී ආරම්භ කරනු ලැබේ.

- 2026 ඒකාබද්ධ අරමුදල් ප්‍රතිපාදන යටතේ නුවරඑළිය කාර්මික විද්‍යාලයේ නව ගොඩනැගිල්ල තෙමහල් ගොඩනැගිල්ලක් ලෙස සැලසුම් කර ඇති අතර, පන්ති කාමර පහසුකම් හා රැස්වීම් ශාලාවක් ඒ තුල ස්ථානගත කිරීමට සැලසුම් කර ඇත.ඒ අනුව මෙම ගොඩනැගිල්ලේ යෝජිත පිරිවැය ඇස්තමේන්තුව රු මිලියන 128.705 ලෙස ඉදිරිපත් කර ඇත.(VAT ගාස්තු ඇතුලත්ව) 2026 අයවැය ප්‍රතිපාදන ලෙස රු මිලියන් 73.80 ක් වෙන් කර ඇති අතර ඉතිරි ප්‍රතිපාදන අවශ්‍යතාවය 2027 වර්ෂයේදී සලසාගත යුතුවේ.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල වැඩහල් සහ විද්‍යාගාර සඳහා වැඩහල් උපකරණ පරිසණක යන්ත්‍ර, සහ අනිකුත් යන්ත්‍ර උපකරණ මිලදී ගැනීමට 2026 වර්ෂය සඳහා ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 121.00 වෙන් කර ඇත.

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පවතින උපදේශක හා ශිල්ප ප්‍රදර්ශක පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති උපදේශක තනතුරු 200 ක් හා ශිල්ප ප්‍රදර්ශක තනතුරු125ක් සඳහා බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

- කාර්මික හා තාක්ෂණ විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය හා කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා වෙනුවෙන් වන යාවත්කාලීන කිරීම් සිදුකිරීම සඳහා කර්මාන්ත අංශය හා ඒකාබද්ධව තාක්ෂණය හා පහසුකම් හුවමාරු කර ගැනීම , ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම , සිසුන් සඳහා රැකියා අවස්ථා උදාකර ගැනීමේ අරමුණින් කර්මාන්ත ක්ෂේත්‍ර සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹීමට සැලසුම් කර ඇත.

- German Adult Education Association DVV International මූල්‍යාධාර හරහා තාක්ෂණ හා කාර්මික විද්‍යාල මඟින් ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික දැනුම ලබා දීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන "Clean Sri Lanka" ජාතික වැඩසටහන යටතේ ප්‍රකාශිත රජයේ මාර්ගෝපදේශ හා ප්‍රතිපත්තිමය තීරණ වෙත අනුගත වෙමින් පොදු ජනතා අපේක්ෂාවන් ඉටුකරනු ලබන රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධන හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## 2.3 වෘත්තීය අධ්‍යාපනයේ අභියෝග

- පවතින සමාජ ආර්ථික බලපෑම හේතුවෙන් වෘත්තීය අධ්‍යාපනයේ ඉලක්ක හා තරුණ කණ්ඩායම නිපුණතාවයක් රහිත අඩු වැටුප් සහිත රැකියාවලට නැඹුරු වීමේ ප්‍රවනතාවය තුළ පාඨමාලා සඳහා යොමුවන ප්‍රමාණය අඩු වීම.

- වෘත්තීය අධ්‍යයන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් අයවැය මඟින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමා වීම තුළින් වෘත්තීය අධ්‍යාපන ආයතනවල නඩත්තු වියදම් කලමනාකරණය කර ගැනීම අපහසු වීම හා ශිෂ්‍ය සුභසාධන පහසුකම් ලබා දීමේ සීමාකාරී තත්වය හමුවේ සිසුන් පාඨමාලා හැරයාමේ ප්‍රවනතාවක් දක්නට ලැබීම හා සමාජීය ඉල්ලුම වැඩි පාඨමාලා සඳහා පුහුණු ධාරිතාවය ඉහල නැංවීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවීම.

- සාමාජීය ආකල්ප හා වෘත්තීය අධ්‍යාපනයේ අවස්ථා හා ඉහල වැටුප් පිළිබඳ දැනුවත්භාවය අඩු වීම හේතුවෙන් කාර්මික පාඨමාලා සඳහා (වෙල්ඩින්, පෙදරේරු, ලී වැඩ වැනි පාඨමාලා සඳහා) අඩු ශිෂ්‍ය ආකර්ෂණයක් පැවතීම.

- කාර්මික පාඨමාලා සඳහා කාන්තා නැඹුරුව අඩුමට්ටමක පැවතීම හා කර්මාන්ත අංශයේ වෘත්තීය අවස්ථා අවම වීම.

- විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන්හි රැකියා ඉල්ලුම පිළිබඳ නිවැරදි දත්ත නොමැති වීම හා පුහුණු ආයතන වල පුහුණු සැලසුම් ඉල්ලුමට අනුකූල ලෙස ක්‍රියාත්මක නොවීමෙන් සමාජ ඉල්ලුම සහිත පාඨමාලාවලින් වැඩි සිසුන් පිරිසක් පුහුණුකිරීම තුල රැකියා අවස්ථා සීමා වීම.

- වයස් බේදය නොසලකමින් වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව වෙත ප්‍රවේශ වීමේ අවස්ථා සීමා වී තිබීම.


- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා පාඨමාලා පැවැත්වීමට බොහෝ විද්‍යාලවල සුදුසු යටිතල පහසුකම් හා එම පුද්ගලයින්ට විශේෂිත වූ පාඨමාලා අවම වීම.

- වේගයෙන් යාවත්කාලීන වන තාක්ෂණයට සමාන්තරව පාඨමාලා නවීකරණයවීම මන්දගාමී වීම හමුවේ පෞද්ගලික අංශයේ තාක්ෂණික පුහුණු ආයතන සමග තරහකාරීව ක්‍රියාත්මක වීම අපහසු වී ඇත.

- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවේශයන් (Digitalization of TVET) සමඟ ඒකාබද්ධව වෘත්තීය අධ්‍යාපනය අවස්ථා පුළුල්කිරීමට යොමුවීම පහල මට්ටමක පැවතීම.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු දීර්ඝ කාලීනව නොපිරවීම මඟින් කාර්මික අධ්‍යාපනයේ ගුණාත්මක භාවයට සෘජුවම බලපා ඇත.


- අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා ප්‍රමාණවත් ධාරිතා වර්ධන පුහුණු අවස්ථා නොලැබීම හා පලපුරුදු වෘත්තිකයන් ක්ෂේත්‍රය අතහැර විදේශගත වීම.



3 වන පරිච්ඡේදය

# වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය




ඒෂිඒ-එල්

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිසාදන 2025 රු. | | සටහන | කකාය 2025 රු. | 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | | | ඒෂිඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම් මත බදු | 3 | | | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අයිමි | | 3,033,256,157 | 2,698,708,242 | ඒෂිඒ-3 |
| - | කැන්පකු | | 176,027,929 | 460,914,887 | ඒෂිඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 55,381,885 | 53,774,189 | ඒෂිඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 3,264,665,971 | 3,213,397,318 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 3,264,665,971 | 3,213,397,318 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | - | 114,340,355 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ) | | 3,264,665,971 | 3,099,056,963 | |
| | අඩු කළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | | | |
| 2,384,500,000 | වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,335,674,237 | 2,062,618,591 | |
| 559,150,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 392,018,050 | 399,645,092 | ඒෂිඒ-2(ii) |
| 270,270,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 120,879,231 | 157,712,012 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 500,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 206,851 | 179,464 | |
| 3,214,420,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 2,848,778,368 | 2,620,155,159 | |
| | මූලධන වියදම් | | | | |
| 89,580,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 88,142,004 | 44,244,205 | |
| 139,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 136,631,038 | 77,036,140 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒෂිඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | |
| 7,000,000 | හැකියා වර්ධනය | 14 | 6,991,814 | 4,999,616 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| 235,580,000 | මුළු මූලධන වියදම් (උ) | | 231,764,855 | 126,279,961 | |
| | නැන්පකු ගෙවීම් | | 198,204,657 | 475,011,366 | ඒෂිඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 74,226,225 | 63,801,822 | ඒෂිඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 272,430,882 | 538,813,188 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 3,352,974,106 | 3,285,248,308 | |
| 3,450,000,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (88,308,134) | (186,191,345) | |
| | අයිමි ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (88,308,134) | (186,191,345) | ඒෂිඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අයිමි ශේෂය | | - | - | ඒෂිඒ-3 |
| | | | - | - | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-පි

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| | | කත්‍ය | |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසිඒ-6 | 12,755,959,170 | 11,329,300,857 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසිඒ-5/5(ඒ) | 110,044,307 | 91,199,967 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසිඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **12,866,003,477** | **11,420,500,824** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 89,943,703 | 48,922,634 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 12,755,959,170 | 11,329,300,857 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසිඒ-5(බී) | - | - |
| **ප්‍රංගම වගකීම්** | | | |
| කැන්පතු ගිණුම් | ඒසිඒ-4 | 20,100,604 | 42,277,333 |
| අග්‍රිම ශේෂය | ඒසිඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **12,866,003,477** | **11,420,500,824** |

පිටු අංක 07 සිට 43 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 44 සිට 93 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.


2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ |
| නම : | නම : | අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| තනතුර : | තනතුර : ඩී. වත්සලා මාරඹගේ | නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව |
| දිනය : 2026.02.26 | දිනය : 2026.02. | දිනය : 2026.02. |

අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ත.පෙ. 537, මිල්කොට් මාවත,

එස් සුසාන්තගේ
ප්‍රධාන ගණකාධිකාරී
ත.පෙ.537,මිල්කොට් මාවත
කොළඹ 10

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය



ඒසිඒ-සී

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | තක්සා | |
|---|---|---|
| | 2025 රු. | සංශෝධිත 2024 රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - |
| ලාභ | | - |
| ආදායම් නොවන ලැබීම් | | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 274,954,582 | 226,571,744 |
| අග්‍රිම ලැබීම් | 3,033,256,157 | 2,698,708,242 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 60,220,354 | 62,175,784 |
| තැන්පතු ලැබීම් | 176,027,929 | 460,914,887 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **3,544,459,023** | **3,448,370,657** |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,326,419,522 | 2,445,315,302 |
| සහනාධාර සහ මාරුකිරීම් | 513,104,131 | 157,891,475 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 95,133,817 | 49,243,821 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 200,757,633 | 65,615,923 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 114,340,356 |
| අත්තිකාරම් ගෙවීම් | 74,208,224 | 63,916,274 |
| තැන්පතු ගෙවීම් | 198,204.657 | 475,011,366 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,407,827,985** | **3,371,334,517** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **136,631,038** | **77,036,140** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | | - |
| ලාභාංශ | | - |
| භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - |
| උපණය අයකර ගැනීම් | | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත්කර ගැනීම් | 136,631,038 | 77,036,140 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **136,631,038** | **77,036,140** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(136,631,038)** | **(77,036,140)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

## 3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**වාර්තාකිරීමේ පදනම**

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම වාර්තාකරණ පදනම යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතුය.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාළ නැත

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගීකර ගැනීමේ කාර්යසාධනය

| වියදම් ශීර්ෂ | වර්ෂය සඳහා වෙන් කල ප්‍රතිපාදන (රු.මිලි) | වියදම 2025 දෙසැම්බර් 31 දක්වා (රු.මිලි) | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | **235.578** | **231.758** | **98** | **95** |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 64.435 | 63.685 | 97 | 89 |
| යන්ත්‍රසූත්‍ර හා උපරකරණ මිලදී ගැනීම | 115.253 | 113.161 | 97 | 95 |
| ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 13.745 | 13.468 | 97 | 98 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව | 16.210 | 15.678 | 95 | 96 |
| වාහන අළුත්වැඩියාව | 9.000 | 3.108 | 35 | 75 |
| මානව සම්පත් සංවර්ධනය | 5.000 | 5.000 | 100 | 95 |
| **පුනරාවර්තන වියදම්** | **2691.352** | **2603.037** | **97** | **100** |
| **විදේශීය අරමුදල් (GIZ)** | **39.93** | **39.93** | **100** | **100** |

**3.6.1 GIZ ව්‍යාපෘතිය (GIZ) තාක්ෂණික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල සූර්ය කාර්මික පාඨමාලා සහ හෝටල් සහ ආගන්තුක සත්කාර පාඨමාලා පැවැත්වීම සඳහා වැඩමුළු වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාව.**

ජර්මානු රජයේ ආධාර මඟින් ලබා දෙන ලද යුරෝ 98.360 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 34.08 ) ක ප්‍රධානය හරහා GIZ VTSL අදියර II යටතේ තෝරාගත් පුහුණු ආයතන කිහිපයක සූර්ය තාක්ෂණ පිළිබඳ පාඨමාලා සහ හෝටල් සහ ආගන්තුක සත්කාර පාඨමාලා පැවැත්වීම සඳහා වැඩහල් වැඩිදියුණු කිරමේ ව්‍යාපෘතිය 2025 පෙබරවාරි 15 සහ 2026 ජනවාරි 15 අතර කාලය තුල ක්‍රියාත්මක කරන ලදී.මෙම ව්‍යාපෘතිය මඟින් නවීන කර්මාන්ත ඉල්ලීම් සමඟ වෘත්තීය පුහුණුව ලබා දීම තුලින් 2023 මැද භාගයේදී 25.8% දක්වා ළඟා වූ ඉහළ තරුණ විරැකියාවට විසඳුම් සෙවීම අරමුණු කර ගෙන ඇති අතර, මෙම අංශවල පුහුණුව ලත් සිසුන් සංඛ්‍යාව 50% කින් වැඩි කිරීම තුලින් සූර්ය බලශක්ති අංශය තුළ රැකියා උත්පාදනය

වැඩිකිරීම මඟින් 2030 වර්ෂය වන විට පුනර්ජනනීය බලශක්තියෙන් 70% ක් ලබා ගැනීමේ ශ්‍රී ලංකාවේ ජාතික ඉලක්කයට සහාය වීමයි.

අනුරාධපුර තාක්ෂණ විද්‍යාල , කළුතර සහ මඩකලපුව කාර්මික විද්‍යාල වල අලුතින් NVQ 4 සූර්ය බලශක්ති තාක්ෂණික පාඨමාලා ස්ථාපිත කරන ලදී. මීට අමතරව, වරකාපොල, නුවරඑළිය, හෝමාගම, ආනමඩුව යන කාර්මික විද්‍යාලවලත් සහ කුරුණෑගල තාක්ෂණ විද්‍යාලයේත් පවත්වාගෙන යන සූර්ය බලශක්ති වැඩහල් වැඩිදියුණු කරන ලදී. තවද තරුණ ශ්‍රම බලකායට කාන්තා දායකත්වය වැඩිකිරීම අරමුණු කරගෙන කාන්තා නැඹුරු පාඨමාලාවක් වන ආගන්තුක සත්කාර අංශය (Hospitality Sector ) වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන මහනුවර තාක්ෂණ විද්‍යාලයේ නව ආගන්තුක සත්කාර කළමනාකරණ මධ්‍යස්ථානයක් සහ මරදාන තාක්ෂණ විද්‍යාලයේ පේස්ට්‍රි සහ බේකරි පුහුණු ඒකකයක් ස්ථාපිත කිරීම ඇතුළත් විය. අදාල පුහුණු ඒකක සඳහා පුහුණු උපකරණ මිලදී ගන්නා ලදී.

කාර්මික හා තාක්ෂණ විද්‍යාල වල පුහුණුව ලබා අවසන් වන සිසුන් වත්මන් වෙළඳපල අපේක්ෂාවන් සපුරාලීම සඳහා සුදුසුකම් සහ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමේ අරමුණින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා රැකියා පුහුණුව (OJT) ලබා දෙන ලදී.

2026 ජනවාරි මාසයේදී ව්‍යාපෘතිය අවසන් වන විට, සියලුම යටිතල පහසුකම් සංවර්ධනය සහ උපකරණ බෙදා හැරීම් සාර්ථකව නිම කරන ලදී. 2026 වර්ෂය ආරම්භ වන විට මෙම ව්‍යාපෘතිය මඟින් වැඩිදියුණු කල වැඩහල් වල පාඨමාලා සඳහා දැනටමත් සිසුන් බඳවා ගනිමින් සිටී; උදාහරණයක් ලෙස, මහනුවර තාක්ෂණ විද්‍යාලයේ ආගන්තුක සත්කාර කළමනාකරණ පාඨමාලාව සඳහා අයදුම්පත් 37 ක්ලැබූ අතර . සූර්ය බලශක්ති තාක්ෂණ පාඨමාලාව සඳහා අයදුම්පත් 150 පමණ ලැබී ඇත. මේ වන විට සිසුන් 139 බඳවාගෙන ඇත.

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව,අනෙකුත් ආයතන / දෙපාර්තමේන්තු විසින් දරණ වියදම්

| දෙපාර්තමේන්තු ශීර්ෂය | නියෝජිත ශීර්ෂය | වැය අංකය | මුදල (රු.) | ආයතනය | විස්තරය |
|---|---|---|---|---|---|
| 215 | 306 | 1003 | 9,254,715.00 | දුම්රිය දෙපාර්තමේන්තුව | නිදහස් වාර ප්‍රවේශ පත්‍ර |
| එකතුව | | | 9,254,715.00 | | |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | 2025.12.31. දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු) | 2025.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රු) | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 3,929,663,942.87 | 5,172,506,510.65 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 1,823,443,459.57 | 1,948,705,973.06 | | 98% |
| 9153 | ඉඩම් | 5,240,612,250.00 | 5,558,075,850.00 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | 335,581,204.44 | 76,670,836.68 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

**3.9 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. VOT/E/DTET/2024/FA/13

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 29 දින

04 JUN 2026
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

වී.ඩී. සීතා
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

පිටපත 1 ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂක ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. VOT/E/DTET/2025/FA/13

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2026 මැයි 29 දින

අධ්‍යක්ෂ ජනරාල්

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල කොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 37 (3) වගන්තිය ප්‍රකාරව, ද්‍රව්‍යමය වශයෙන් ප්‍රදාන ලබා ගන්නා රාජ්‍ය අස්ථිත්වයක් විසින් අදාළ ලිඛිත නීතියට අනුකූලව එම ප්‍රදානයේ මුදල් වටිනාකම තීරණය කර ගිණුම් ගත කළ යුතු වන අතර අංක 02/2025 හා 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 8.2 වගන්තිය ප්‍රකාරව, තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයකට ගිණුම්ගත කළ යුතු වුවත් තාක්ෂණ විද්‍යාල 7 ක් සහ කාර්මික විද්‍යාල 23 ක් වෙත, සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් විදේශ ණය ව්‍යාපෘති සහ දේශීය ආයතන වලින් පරිත්‍යාග ලෙස ලද වාහන අයිතම 329 ක් හා හෝටල් සංචාරක ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා සඳහා මුළුතැන්ගෙයි උපකරණ වර්ග 49 කට අදාළ අයිතම 64 ක් 2025 නොවැම්බර් 19 දින පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණ ද, ඉහත නියමයක් අනුව මූල්‍ය ප්‍රකාශන මගින් වාර්තා කර නොතිබුණි. තවද කාර්මික/ තාක්ෂණ විද්‍යාල 39 ක් වෙත විදේශ ණය ව්‍යාපෘති, දේශීය ආයතන වලින් හා පුද්ගලයින්ගෙන් පරිත්‍යාග ලෙස ලද යන්ත්‍ර, උපකරණ හා වෙනත් ස්ථාවර වත්කම් පැවතියද එම වත්කම් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) නුවරඑළිය කාර්මික විද්‍යාලයේ යෝජිත සිවි මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී අංක 1973 දරන වවුවර පත මගින් ලබා දුන් රු. මිලියන 10 ක අත්තිකාරම් මූල්‍ය නොවන වත්කම් යටතේ කෙරීගෙන යන වැඩ (WIP) ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, එම වටිනාකම ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනීත කර තිබුණු බැවින් ගොඩනැගිලි වටිනාකම රු. මිලියන 10 කින් වැඩියෙන් ද කෙරීගෙන යන වැඩ වටිනාකම එම අගයෙන් අඩුවෙන් ද සටහන් වී තිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනැති අංක 4/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ අංක 05 ඡේදය සහ කොම්ප්ට්ලර් ජනරාල් කාර්යාලය විසින් 2018 දෙසැම්බර් 31 දින නිකුත්කළ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය අනුව, ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු තාක්ෂණික හා කාර්මික විද්‍යාල 12 ක පවතින අක්කර 298 රූඩ් 0.4 පර්චස් 28.22 ක් වූ ඉඩම් ඒ අනුව, ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) කෙරීගෙන යන වැඩ-ගොඩනැගිලි සහ ඉදිකිරීම් (611140) ගිණුමේ ඇතුළත් රු.මිලියන 258.91 ක් සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාල ගොඩනැගිලි (6111201) ගිණුමට ප්‍රාග්ධනිත කර තිබූ නමුත් එම වටිනාකම් සහිත ඉදිකිරීම් කොන්ත්‍රාත් නිසි ලෙස හඳුනාගැනීම සඳහා එම කොන්ත්‍රාත් ආරම්භ කළ හා අවසන් කළ කාල සීමාවන්, ගොඩනැගිලි භාර ගැනීමේ ලේඛන, කොන්ත්‍රාත්කරුට ගෙවූ අවසන් බිල්පත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ගිණුමෙහි ඇතුළත් රු.මිලියන 76.671 ක් වූ වටිනාකම සනාථ කර ගැනීමට අදාල ව්‍යාපෘතිය නම, සිදුකරන ඉදිකිරීම, කොන්ත්‍රාත් ගිවිසුම, ව්‍යාපෘතීන් ආරම්භක හා අවසාන කාල සීමාවන් ඇතුළත් විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) CIGAS ස්ථාවර වත්කම් මොඩියුලයෙහි කාර්යාල ගොඩනැගිලි ගිණුම (6111201) තුළ ප්‍රාග්ධනිත කර ඇති වටිනාකම් ගොඩනැගිල්ලට අදාළ කේතයකට හෝ ව්‍යාපෘතියට අදාළව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම් වෙන්කර හඳුනාගත නොහැකි විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාල ගොඩනැගිලි (9151) හා ඉඩම් (9153) ගිණුමට ආරම්භක ශේෂ ගැලපීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබූ පිළිවෙලින් රු.මිලියන 1,319.073 ක හා රු. මිලියන 317.464 ක වටිනාකම ඇතුළත් විස්තරාත්මක වත්කම් ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 110 (1) ප්‍රකාරව, සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම මුදල් රෙගුලාසි 102 යටතේ හානි පිළිබඳ විස්තර සටහන් පවත්වාගෙන යා යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි පාඩු ලේඛනයේ රජයේ දේපළ හානි 2022 වර්ෂයෙන් පසුව නිසි පරිදි සටහන් කර යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | තාක්ෂණ විද්‍යාල 07 ක් සහ කාර්මික විද්‍යාල 23 ක් වෙත , සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් විදේශ ණය ව්‍යාපෘති සහ දේශීය ආයතන වලින් පරිත්‍යාග ලෙස වර්ෂ කිහිපයක සිට ලැබී තිබූ වාහන අයිතම 329 ක් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත්කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර කාර්මික/ තාක්ෂණ විද්‍යාල 39 වෙත විදේශ ණය ව්‍යාපෘති,දේශීය ආයතන වලින් හා පුද්ගලයින්ගෙන් පරිත්‍යාග ලෙස ලද යන්ත්‍ර, උපකරණ හා වෙනත් ස්ථාවර ස්වරූපයේ වත්කම්වල වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1 (අ) |

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 අනුව, හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 39 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිවීම් වටිනාකම රු.මිලියන 284.401 ක් වූ අතර එක් එක් වැය විෂයයෙහි ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස සියයට 36 ත් සියයට 100 ත් අතර පරාසයක පැවතුණි.

(ආ) වැය විෂයයන් 14 ක මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර තිබූ ප්‍රතිපාදන වටිනාකම රු.මිලියන 19.999 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වටිනාකමට සාපේක්ෂව සියයට 11 ත් සියයට 100 ත් අතර පරාසයක පැවතුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) මුදල් රෙගුලාසි 217 (i) ප්‍රකාරව, කිසියම් මුදල් වර්ෂයක් තුළදී ගෙවීමට නියමිත මුදල් සියල්ලක්ම හැකිතාක් දුරට එම වර්ෂය අවසාන වීමට පෙර ගෙවා නිම කිරීමේ පරම අවශ්‍යතාව ගණන් දීමේ නිලධාරීන් විසින් සිය යටත් නිලධාරීන්ට මැනවින් අවබෝධ කළ යුතු වුවද අංක 215-2-2-2001 හා 215-2-2-1003 දරන වැය විෂයයන්ට අදාලව අවස්ථා 2 කදී ප්‍රතිපාදන ඉතිරිවීම් නිබියදීත් රු.මිලියන 3.131 ක වටිනාකමක් සහිත ගෙවීම් වර්ෂය තුළදී සිදු නොකර ඉදිරි වර්ෂයේ දී ගෙවීම් කර තිබුණි.

(ආ) වැය විෂයයන් 08 කට අදාළව සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ලේඛණයේ සඳහන් කර තිබූ ශේෂයන් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් SA 92 ආකෘතියේ සඳහන් කර තිබූ ශේෂයන් අතර රු. මිලියන 14.991 ක වෙනසක් නිරීක්ෂණය විය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| i. ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 35.1 වගන්තිය | එක් අවස්ථාවකදී පැය එකහමාරක කාලයක් නොඉක්මවන පරිදි, මසකට දෙවරක් බැහින් සීමා කොට නිලධරයෙකුට කෙටි නිවාඩු ලබාදිය හැකි වුවත් ඊට පටහැනිව 2025 වර්ෂයේ අප්‍රේල්, මැයි හා ජුනි මාසවල කෙටි නිවාඩු පරීක්ෂා කිරීමේදී, නිලධාරීන් 15 දෙනෙකු විසින් මසකට අවස්ථා 3 සිට අවස්ථා 10 ක් දක්වා කෙටි නිවාඩු ලබාගෙන තිබුනද ඒ සඳහා නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| ii. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයෙහි 5.6 වගන්ති | නිලධරයෙකුගේ වැටුපෙන් අයකරන නිවාස කුලිය ඔහුට දී තිබෙන නිවාසයේ සාධාරණ ආර්ථික කුලියට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වන්නේ නම් නිලධරයාගේ වැටුපෙන් සියයට ගණනක් අයකර ගැනීම වෙනුවට නිශ්චිත නිවාස කුලියක් අයකර ගැනීමට ලේකම්වරයාගේ අවසර ලබාගත යුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් කාර්මික/ තාක්ෂණ විද්‍යාල 9 ක නිල නිවාස 135 ක ආර්ථික කුලිය අයකර ගැනීම සඳහා ලේකම්වරයාගේ අනුමැතිය නොගෙන හා වඩා සාධාරණ තක්සේරු අගයක් ලබාගැනීම සඳහා නිල නිවාසයන්හි ආර්ථික කුලිය නිරන්තර තක්සේරුවට ලක් කිරීමෙන් තොරව පැවතුණි.එසේම නිළධාරීන් පදිංචි නිල නිවාස 68 ක ආර්ථික කුලිය අවසන් වරට තක්සේරු කර වසර 05 ත් වසර 15 ත් අතර කාල පරාසයක් ගත වී ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් නිල නිවාස වල පදිංචි නිලධාරීන්ගෙන් අයකරනු ලබන ආර්ථික කුලිය ඉතා අඩු අගයක් ගන්නා බව නිරීක්ෂණය විය. එසේම, 2025 දෙසැම්බර් 31 දින වන විට කාර්මික/ තාක්ෂණ විද්‍යාල 05 කට අයත් නිල නිවාස 18 කට අදාළව තක්සේරු කරන ලද ආර්ථික කුලියට වඩා රු.මිලියන 0.416312 ක් අඩුවෙන් නිල නිවාස කුලි අයකරගෙන තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 262 (2) | ගෙවන ලද සියලුම වවුවර වලත් ඒවා තහවුරු කෙරෙන ලියවිලිවලත් "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතු වුවත් වටිනාකම රු.මිලියන 4.703 ක් වූ පරීක්ෂා කරන ලද වවුවර 11 කට අදාළව " ගෙවන ලදී" මුද්‍රාව තබා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 262 (3) අනුව, ගෙවීම්කළ වහාම ගෙවන නිළධාරියා විසින් සිය අත්සන හෝ කෙටි අත්සන හෝ අදාළ ගෙවූ වවුවර වල හා තහවුරු කරන ලියවිලි වල යෙදිය යුතු වුවත් ඒ අනුවද කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1992 ජනවාරි 25 දිනැති අංක 03/ 92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (I) හා 2016 පෙබරවාරි 11 දිනැති අංක 01/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | පෙ.ව. 8.30 ත් 9.00 ත් අතර ඕනෑම වේලාවක කාර්යාලයට පැමිණෙන නිලධාරියෙකුට එසේ ප්‍රමාද වන කාලය ප.ව. 4.15 න් පසුව වැඩ ආවරණය කිරීමට හා 2 (II) අනුව, පෙ.ව. 08.00 ත් පෙ.ව. 08.15 ත් අතර කාර්යාලයට පැමිණෙන සුළු සේවකයින්, එසේ ප්‍රමාද වූ කාලය ප.ව. 04.45 න් පසුව ආවරණය කිරීමට ද ඉඩ දී ඇති බව සඳහන් කර තිබුණද 2025 වර්ෂයේ අප්‍රේල්, මැයි |

| | | |
|---|---|---|
| | ලිපියෙහි 02 ඡේදය | හා ජුනි මාසවලට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂාවට අනුව, නිලධාරීන් තිදෙනෙකු ඊට පටහැනිව, අවස්ථා 18 කදී ඉඩ දී ඇති ප්‍රමාදවීම් 02 ක් ඉක්මවා ප්‍රමාද කාලය ආවරණය නොකර කාර්යාලයෙන් පිටවී තිබුණු අතර 1994 ජනවාරි 21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/94 හි විධිවිධාන අනුව එම ප්‍රමාදවීම් සඳහා නිවාඩු අනුමත කරවාගෙනද නොතිබුණි. |
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/ 2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 02 (iii) ඡේදය | නිත්‍ය රාජකාරියට වාර්තා කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කළයුතු බවත්, එම චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව, අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම වෙනුවෙන් එක් එක් ආයතන නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, පැමිණීමේ ලේඛනයක අත්සන් තැබීම මගින් සනාථ කර ගන්නේ නම් එය ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමේ ක්‍රමයට අමතරව කළයුතු බවත් දක්වා තිබුණ ද, 2025 වර්ෂයේ අප්‍රේල්, මැයි හා ජුනි මාසවල අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් 16 දෙනෙකු අවස්ථා 90 කදී ද කාර්යමණ්ඩල නිලධාරීන් 68 දෙනෙකු අවස්ථා 329 කදී රාජකාරී සඳහා පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කර නොතිබුණි. |
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | |
| i. | 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්පිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදු කළයුතු වුවත් දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන 69 න් වාහන 65 ක් සඳහා අවසන් වරට ඉන්ධන පරීක්ෂාව සිදු කර වර්ෂ 1 න් 14 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණි. |
| ii. | 04 ඡේදය | වාහන අලුත්වැඩියා කිරීමේදී සීමාවක් නොමැතිව මාස ගණන්, වර්ෂ ගණන් පමා වීම වැලැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හඳුන්වා දී තිබුණ ද, එම විධිවිධාන අනුව කටයුතු නොකිරීම හේතුවෙන්, දෙපාර්තමේන්තුවට අයත් වාහන 5 ක් අලුත්වැඩියා |

කටයුතු සඳහා යොමුකර මාස 09 ත් අවුරුදු 03 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණද අලුත්වැඩියා කටයුතු නිමකර ධාවන තත්වයට පත් නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය

රජයේ වාහන වල රාජ්‍ය ලාංඡනය යෙදීමට අමතරව අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නමද සටහන් කිරීමට ක්‍රියා කරන මෙන් සියළු ආයතන ප්‍රධානීන්ට උපදෙස් දී තිබුණ ද, 2026 මාර්තු 06 දින සිදු කරන ලද වාහන භෞතික පරීක්ෂාවට අනුව, දෙපාර්තමේන්තු රථගාලෙහි හා නඩත්තු අංශයෙහි ගාල්කර තිබූ වාහන 11 ක දෙපාර්තමේන්තුවේ නම සටහන් කර නොතිබූ අතර වාහන 09 ක රාජ්‍ය ලාංඡනය යෙදීමද සිදුකර නොතිබුණි.

(උ) 2020 අගෝස්තු 08 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය

ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 ට පෙර අදාළ මුදල් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කළ යුතු වීම හා මාර්තු 31 ට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තා පිළියෙල කල යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2026 වර්ෂයේ මැයි 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) 2023 අගෝස්තු 24 දිනැති අංක 06/2023 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය

ආයතනයේ සියළුම රථවාහන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට NFAMS පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කරන ලද වාර්තාවන් CGO/NFAMS/V/02 ආකෘතිය මගින් කොමිප්ට්‍රෝලර් ජෙනරාල් වෙත ඊළඟ වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර යැවිය යුතු වුවත් මෙම වාර්තාවේ දින වන විටත් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.4 අවධිමත් ගනුදෙනු

(අ) සංශෝධිත මුදල් රෙගුලාසි 124 (2) (අ) හා (ආ) අනුව, භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව දෙපාර්තමේන්තු මුදල් කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන අමාත්‍යාංශ ලේකම් යතු වගකීමක් වන අතර අංක 23/0256/604/030 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, එම කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ජාතික ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා කර කෙටි කාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලැස්මක් සකස් කර එම නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වුවද රිට පටහැනිව, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යතු තාක්ෂණික ව්‍යෘත්තීය පුහුණු

ආයතන (TITP) ගොඩනැගිල්ලේ තුන්වන මහල දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත පදනම්ව පෞද්ගලික සමාගමක් වෙත වසර 15 ක කාලයකට අවබෝධතා ගිවිසුමක් මත 2023 ඔක්තොම්බර් 19 දින සිට බදු පදනමට ලබා දී තිබූ අතර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතන (TITP) ගොඩනැගිල්ලේ තුන්වන මහල තුලියට දීමට අදාළ අවබෝධතා ගිවිසුමෙහි 1.3 ඡේදය ප්‍රකාරව, ගිවිසුම්ගත දින සිට මාස 04 ක් දක්වා මාසික දළ පාඨමාලා ගාස්තු ආදායමෙන් සියයට 5 ක් හෝ රු.500,000 යන්නෙන් වැඩි අගය ද, මාස 05 සිට වසරක් වන තෙක් මාසික දළ පාඨමාලා ගාස්තු ආදායමෙන් සියයට 5 ක් හෝ රු.700,000 යන්නෙන් වැඩි අගය ද, ඉන්පසු, මාසික දළ පාඨමාලා ගාස්තු ආදායමෙන් සියයට 5 ක් හෝ රු.1,200,000 යන්නෙන් වැඩි අගය ද අදාල පෞද්ගලික සමාගම විසින් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වුවත්, දෙපාරතමේන්තුව විසින් අදාල පෞද්ගලික සමාගමේ මාසික දළ පාඨමාලා ගාස්තු ආදායම සනාථ කර ගැනීමකින් හා අවශ්‍ය විගණිත ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමකින් තොරව කොළඹ ශාඛාවේ කටයුතු ආරම්භ කල දින සිට ගිවිසුමේ සඳහන් කාලයන් තුළ රු.500,000, රු.700,000 හා රු.1,200,000 ක් බැගින් ගොඩනැගිලි බදුකුලි අයකරගෙන තිබුණි.

(ඇ) නිපුණතා පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ හෝමාගම කාර්මික විද්‍යාලයේ නවීකරණ කටයුතු සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරු විසින් අමාත්‍යාංශයේ ලිඛිත අවසරවකින් තොරව 2025 ජනවාරි මස දී විද්‍යාල භූමියේ ක්‍රීඩා පිටිය අසලින් සහ අඩි 11,677 ක පමණ පස් ප්‍රමාණයක් කපා තිබුණු අතර ඊට අදාලව දෙපාර්තමේන්තුව විසින් ගණුලැබූ පියවර විගණනයට අනාවරණය නොවුණි.

3.5 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ඡේදය ප්‍රකාරව, අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම තත්කාර්යය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද අවස්ථා 46 කදී ලබාගත්, වටිනාකම රු.මිලියන 2.679ක් වූ අතුරු අග්‍රිම දින 14 ත් දින 90 ත් අතර කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

(ආ) නිලධාරියෙකුට ලබා දෙනු ලබන එක් අතුරු අග්‍රිමයක් පියවීමෙන් පසුව පමණක් නැවත අතුරු අග්‍රිමයක් ලබා දිය යුතු වුවද අවස්ථා 09 කදී නිලධාරීන් තිදෙනෙකුට ලබා දුන් අතුරු අග්‍රිම පියවීමකින් තොරව වටිනාකම රු.මිලියන 1.571ක් වූ අතුරු අග්‍රිම නැවත එම නිලධාරීන් වෙත ලබා දී තිබුණි.

(ඇ) සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ප්‍රකාරව, කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම ලබා දිය යුතු අතර එම මූල්‍ය සීමාව ඉක්මවීමට අවශ්‍ය වන අවස්ථාවලදී ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ නිර්දේශයද සහිත ඉල්ලීමක් මගින් මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබා ගැනීමට ප්‍රථම අවසරය ලබා ගත යුතු වුවත්, එකම කාර්යයක් සඳහා වටිනාකම රු.693,706 ක් වූ අතුරු අග්‍රිම අවස්ථා 04 කදී නිලධාරීන් දෙදෙනෙකුට ලබා දී තිබූ අතර ඒ අනුව, රු.100,000 මූල්‍ය සීමාව ඉක්මවා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.293,706 ක අතුරු අග්‍රිම ලබා දී තිබුණි.

(ඈ) සංශෝධිත මුදල් රෙගුලාසි 371 (4) ප්‍රකාරව, නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුවද මරදාන තාක්ෂණ විද්‍යාලයේ කුලසිංහ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සහ අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් තෝරාගන්නා කොන්ත්‍රාත්කරුවකු මඟින් සිදු කිරීමේ හැකියාව තිබියදී එසේ කටයුතු නොකර අවස්ථා 11 කදී එකතුව රු.958,000 ක අතුරු අග්‍රිම ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා ලබා දී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) 2024 - 2027 උපායමාර්ගික සැලැස්මේ අරමුණු 02 අනුව, ශිෂ්‍ය බඳවාගැනීම් 2027 වර්ෂය වන විට 40,000 දක්වා වැඩි කිරීම අරමුණු කර ගනිමින් 2024, 2025 වර්ෂවලදී ශිෂ්‍යයින් පිළිවෙලින් 30,000 ක් හා 33,000 ක් ලෙස බඳවා ගැනීමට සැලසුම් කර තිබුණ ද, 2024 වර්ෂයේදී පාඨමාලා 129 කට සිසුන් 25,129 ක් ද 2025 වර්ෂයේදී පාඨමාලා 166 කට සිසුන් 26,386 ක් ද බඳවාගෙන තිබුණු නමුත්, එම වර්ෂ වලදී පිළිවෙලින් අයදුම්පත් 75,034 ක් හා 64,954 ක් ලැබී තිබුණු බැවින් දෙපාර්තමේන්තුවේ ධාරිතාවය උපරිම මට්ටමින් උපයෝජනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ උපායමාර්ගික සැලැස්ම අනුව, පාඨමාලා හැරයන ප්‍රතිශතය අඩු කිරීම සඳහා 2025 වර්ෂයට රු. මිලියන 240 ක් අයවැය මගින් වෙන් කර තිබුණු අතර, පාඨමාලා හැරයන සිසුන් ප්‍රමාණය අවම කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, පාඨමාලා ගුණත්වය වැඩි කිරීම, ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කර තිබුණ ද 2023 වර්ෂයේදී සියයට 17 ක්ව පැවති පාඨමාලා හැරයන ප්‍රතිශතය 2025 වර්ෂයේදී සියයට 20 ක් දක්වා වැඩි වී තිබුණි.

(ඇ) උපායමාර්ගික සැලසුම් අංක 01 අනුව හඳුන්වාදුන් නව පාඨමාලා 6 ක් සමාලෝචිත වර්ෂයේදී එක් කාර්මික/ තාක්ෂණ විද්‍යාලයක පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර , Food & Beverage Assistant පාඨමාලාව කාර්මික විද්‍යාල 2 ක ද, Nurse Assistant පාඨමාලාව කාර්මික විද්‍යාල 3 කද, Solar Photovoltaic Technician පාඨමාලාව කාර්මික/ තාක්ෂණික විද්‍යාල 7 කද, Tailoring පාඨමාලාව කාර්මික/ තාක්ෂණික විද්‍යාල 9 ක ද පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ප්‍රාදේශීය වශයෙන් පාඨමාලා සඳහා පවතින ඉල්ලුම අධ්‍යනය කර පාඨමාලා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව, Southern Maritime Training Institute සමඟ අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුම යටතේ මරදාන තාක්ෂණ විද්‍යාලයේ නාවික ප්‍රවාහන කළමනාකරණය ක්ෂේත්‍රයේ පුහුණුව ලබන සිසුන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා එම ආයතනයෙන් ලබා දීමට එකඟ වී තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් මරදාන තාක්ෂණ විද්‍යාලයේ කිසිඳු සිසුවෙකුට Southern Maritime Training ආයතනයේ පුහුණුව ලබා දීමට කටයුතු කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන සැලැස්මකට අනුව ඉටු කළ යුතු අතර හාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.3 ඡේදය අනුව, දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් පිහිටුවා ඒ අනුව, ප්‍රසම්පාදන කටයුතු කිරීමට ද ඒ මගින් රාජ්‍ය ප්‍රසම්පාදන මූලධර්ම සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු වුවද ප්‍රසම්පාදන කළමණාකරන අංශයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත වූ ආපනශාලාව පවත්වාගෙන යාමට අදාල ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව ලිඛිත ගිවිසුමක් අත්සන් කල යුතු වුවත්, 2024 මාර්තු 11 දින සිට 2025 මාර්තු 11 දින දක්වාත් 2025 මාර්තු 12 දින සිට 2025 සැප්තැම්බර් 24 විගණිත දින දක්වාත් ලිඛිත ගිවිසුමක් නොමැතිව ආපනශාලා කොන්ත්‍රාත්තුව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සහකාර 1 ශ්‍රේණියේ තනතුරක සේවය කරන නිලධාරිනියකගේ ආඝන්නතම ඥාතියෙකු වෙත ලබා දී තිබුණු අතර එම නිලධාරිනිය විසින් සිය රාජකාරී වේලාවේදී ආපනශාලාව පවත්වාගෙන යනු ලබන බව සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී අනාවරණය විය.මෙම නිලධාරිනිය සඳහා නිත්‍ය තනතුරේ රාජකාරී වෙනුවෙන් 2024 මාර්තු 11 දින සිට විගණිත දින වන 2025 සැප්තැම්බර් 24 දින දක්වා කාලය තුල රු.මිලියන 1.101 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඇ) 2024 නොවැම්බර් 15 දින සිට 2025 නොවැම්බර් 14 දින දක්වා ආරක්ෂක සේවාව ලබා ගැනීමට ප්‍රසම්පාදන දැන්වීම පළ කර තිබුණ ද, ප්‍රසම්පාදන කමිටු තීරණය නොසලකා අධ්‍යක්ෂක ජනරාල්ගේ 2024 නොවැම්බර් 01 දිනැති ලිඛිත සටහන අනුව 2024 දෙසැම්බර් 01 දින සිට 2025 පෙබරවාරි 28 දින දක්වා මාස 03 ක කාලයකට ආරක්ෂක සේවාව සැපයීම සඳහා පෞද්ගලික සමාගමක් සමග රු.මිලියන 14.677 ක වටිනාකමකින් යුත් ගිවිසුමකට 2024 නොවැම්බර් 20 දින එළඹ තිබුණු අතර 2025 මාර්තු 28 දින සිට 2026 මාර්තු 31 දින දක්වා එම සේවාව ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් නෝරාගනු ලැබූ සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ඈ) පවිත්‍රතා සේවා කොන්ත්‍රාත්තුව සඳහා 2024 නොවැම්බර් 27 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණ අංක 48 මඟින් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව ප්‍රතික්ෂේප කරන ලද ආයතනයක් වෙත පවිත්‍රතා සේවාව සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කල ලංසුකරු වීම හා එමඟින් රජයට වාර්ෂිකව ලක්ෂ 40 කට ආසන්න අගයක වාසියක් සිදුවන බව සඳහන් කරමින් අධ්‍යක්ෂක ජනරාල් විසින්, 2024 දෙසැම්බර් 15 දින සිට 2025 දෙසැම්බර් 14 දක්වා කාලයට අදාළව අවස්ථා 2 කදී එම ආයතනයන් සමඟ ගිවිසුම් වලට එළඹ තිබුණි.මෙම, පවිත්‍රතා සේවයට අදාල කොන්දේසි පත්‍රිකාවෙහි අංක 04 (IV) ට අනුකූලව, පවිත්‍රතා සේවය සපයන ආයතනය 1934 අංක 34 දරන කම්කරු ආඥා පනත යටතේ හෝ වෙනත් කම්කරු නීතියක් යටතේ සේවකයන් සඳහා ඊ.ටී.එෆ්/ ඊ.පී.එෆ් (ETF/EPF) ගෙවන ආයතනයක් බව තහවුරු නොවීය. එසේම, පවිත්‍රතා සේවය ලබා ගැනීමේ ක්‍රොන්ත්‍රාත් ගිවිසුමට අදාලව ගිවිසුම්කාර ආයතනය දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගත වීමේදී ලංසු සුරක්ෂණ (කාර්ය සාධන ඇපකරය) මුල් පිටපත ලෙස ව්‍යාජ කාර්ය සාධන ඇපකරයක් දෙපාර්තමේන්තුව ලබාදී ඇති බව අනාවරණය කරගෙන තිබුණද ගිවිසුම්ගත ආයතනය විසින් කූඨ ලේඛණ ඉදිරිපත් කර රජයට සිදු කරන ලද වංචනික ක්‍රියාව සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

4.3 වත්කම් කළමණාකරණය

ස්ථාවර වත්කම් භෞතික පරීක්ෂාවට අනුව, දෙපාර්තමේන්තුවෙහි වත්කම් මතුපිට හඳුනාගැනීමේ අංක සලකුණු කර නොතිබීම හේතුවෙන් භෞතික වත්කම් සහ සථාවර වත්කම් මොඩියුලය අතර සැසඳීමක් සිදුකළ නොහැකි විය.

4.4 පාඩු හා හානි

(අ) දෙපාර්තමේන්තුවට අයත් කාර්මික/ තාක්ෂණික විද්‍යාල 04 කට අදාළව 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා අවස්ථා 06 කදී සිදු වී තිබූ එකතුව රු. මිලියන 6.289 ක වටිනාකමක් වූ අලාභහානි මු.රෙ. 110 අනුව, පවත්වාගෙන යනු ලබන හානි පාඩු ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව, අලාභහානි සම්බන්ධව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම එවිය යුතු අතර මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව, පරීක්ෂණයෙන් පසු අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් වටිනාකම රු.මිලියන 10.585 ක් වූ අලාභ හානි 7 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව, දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි හා පාඩු ලේඛනයේ ඇතුළත් කර ඇති අවස්ථා 2 කදී අයකරගත් හා පොතෙන් කපා හල එකතුව රු. 258,995 ක් වූ අලාභහානි පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ඇමුණුම (ii) ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (ii) ප්‍රකාශනයේ සටහන් කර තිබූ අලාභ වටිනාකම මු.රෙ. 110 අනුව, ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන හානි පාඩු ලේඛනයේ සටහන් කර ඇති වටිනාකම් අතර රු.266,709 ක වෙනසක් නිරීක්ෂණය විය.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 204 කින් 31 ක් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ද අනෙක් පාඨමාලා 173, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් ද ප්‍රතීතනය කරන අතර කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරනු ලබන පාඨමාලා 31 න් පාඨමාලා 19 ක් අවුරුදු 14 ත් 6 ත් අතර කාලයකින් යාවත්කාලීන කර නොතිබුණු අතර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මඟින් යාවත්කාලීන කරනු ලබන පාඨමාලා 173 ක් යාවත්කාලීන කිරීම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කාර්මික/ තාක්ෂණ විද්‍යාල 10 කට අදාළ නිල නිවාස 40 ක කිසිදු නිළධාරියෙකු පදිංචි වී නොමැතිව නිශ්කාර්යව පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතු කාර්මික/ තාක්ෂණික විද්‍යාල 19 ක ඉඩම් අක්කර 364 රූඩ් 03 පර්චස් 13.28 ක් හා එම ඉඩම් වල පිහිටි ගොඩනැගිලි 302 ක අයිතියද දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවට අයත් රු.මිලියන 9.5 ක වටිනාකමකින් යුතු වාහන 3 ක් විගණික දින වන විට මාස 06 ත් වර්ෂ 10 ත් අතර කාලයක සිට භාවිතයට නොගෙන නිශ්කාර්යයව පැවතුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ සිට මිය ගිය, විශ්‍රාම ගිය,වැඩ තහනම් කළ,සේවය අවසන් කළ, සේවය අතහැර ගිය සහ සේවයෙන් පහ කරන ලද නිලධාරීන් 50 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවිය යුතු රු.මිලියන 3.186 ක ශේෂයක් වසර 01 සිට 20 දක්වා කාලයක සිට පැවතුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ප්‍රධාන කාර්යාලයේ අනුමත තනතුරු 23 ක් සඳහා පුරප්පාඩු 129 ක් පැවති අතර තනතුරු 8 ක් සඳහා අතිරික්ත නිළධාරීන් 16 ක් අනුයුක්ත කර තිබුණි.කාර්මික විද්‍යාල /තාක්ෂණ විද්‍යාල වල කාර්යය මණ්ඩල තනතුරු 37 ක් සඳහා පුරප්පාඩු 1543 ක් හා තනතුරු 5 ක් සඳහා අතිරික්ත නිළධාරීන් 13 ක් අනුයුක්ත කර තිබුණද දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර පවත්වා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2024 මැයි 30 දිනැති අංක 21/2024 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව, එකම සේවා ස්ථානයක වසර පහකට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වුවත් 2025 දෙසැම්බර් 31 දින වන විට වසර 06 කට වැඩි කාලයක් නිලධාරීන් 282 ක් එකම සේවා ස්ථානයක සේවය කර තිබුණි.

(ඇ) 2024 ජූලි 29 දිනැති අංක 02/ 2024 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, නිලධරයන්ට මෙන්ම රාජ්‍ය සේවාවටද ඇතිවන අපහසුතා මහහැරීම පිණිස ස්ථානමාරු පිළිබඳ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට ආයතනය විසින් සැලකිලිමත් වියයුතු බව දක්වා තිබුණද වර්ෂ 06 කට වඩා වැඩි කාලයක් එකම රාජකාරී ස්ථානයේ සේවයේ නියුතු ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන් 244 දෙනෙකු මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ යොදවා තිබුණි.

(ඈ) 2024 සැප්තැම්බර් 13 දිනැති අංක 18/ 2024 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය ක්‍රියාත්මක විය යුතු වුවත් 2015 මාර්තු 09 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා වසර 10 කට අධික කාලයක් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සැලසුම් තනතුරෙහි එකම නිලධරයකු සේවයේ යොදවා තිබුණි.

වී.ඩී. සීතා
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

4 වන පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

### දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශක

| විශේෂිත දර්ශකය | කාර්යසාධන දර්ශකය ගණනය කිරීම | සැබෑ ප්‍රතිඵලය අපේක්ෂිත ප්‍රතිඵලයේ ප්‍රතිශතයක් (%) ලෙස | | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| | | 100 % - 90 % | 75 %- 89% | 50 %- 74% | |
| 1. පාඨමාලා සම්පූර්ණ කරන ප්‍රතිශතය | පාඨමාලා සම්පූර්ණ කල ශිෂ්‍ය සංඛ්‍යාව X 100<br>බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව | | √ | | |
| 2. පුහුණු ධාරිතා උපයෝජන ප්‍රතිශතය | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100<br>බඳවාගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව | | √ | | |
| 3. ශිෂ්‍ය බඳවාගැනීමේ ප්‍රතිශතය | බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100<br>අයදුම්කළ සංඛ්‍යාව | | | √ (අයදුම් කළ සංඛ්‍යාවෙන් 60 % කට වඩා වැඩි ප්‍රමාණයක් බඳවා ගෙන ඇත.) | |
| 4. ඒකක පුහුණු පිරිවැය (රු) | වාර්ෂික මුළු පුනරාවර්තන පිරිවැය<br>වර්ෂයට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | | | රු88,387.64 |
| 5. රැකියාගතවීමේ ප්‍රතිශතය | රැකියාගත සංඛ්‍යාව X 100<br>පාඨමාලා සම්පූර්ණ කල සංඛ්‍යාව | | | √ | රැකියාගත තොරතුරු වාර්තා කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා පහසුකම් සපයා ඇත./NVQ 5/6 ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයේදී රැකියාගත ප්‍රමාණය සමීක්ෂණ මඟින් ගණනය කර ඇත. (69%) |
| 6. මුළු වියදම් සඳහා ආදායම් උත්පාදිත අරමුදල් | පාඨමාලා ගාස්තු ලෙස අයකල මුදල් ප්‍රමාණය x100<br>වාර්ෂික මුළු පුනරාවර්තන වියදම | | | | 8% |
| 7. පවතින අධ්‍යයන කාර්යමණ්ඩල ධාරිතාව | දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100<br>අවශ්‍ය උපදේශක සංඛ්‍යාව | | | | 47 % |
| 8. අනුමත සේවක සංඛ්‍යාව මත පදනම්ව උපදේශකවරුන්ගේ ධාරිතාව | දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100<br>අනුමත සේවක සංඛ්‍යාව | | | | 40 % |

5 වන පරිච්ඡේදය

# තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක

| ඉලක්කය අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ දර්ශක | ඉලක්ක සපුරා ගැනීම් වල ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 4.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. | 4.3: 2030 වන විට, සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහල සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාලය අධ්‍යාපනයද ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම. | 4.3.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගිත්ව අනුපාතය | වාර්ෂිකව බඳවාගත් කාන්තා සිසුන් සංඛ්‍යාව | √ 35% ක කාන්තා ශිෂ්‍ය සංඛාවක් බඳවා ගෙන ඇත | | |
| | 4.4: 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්ව සඳහා තාක්ෂණික සහ වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයන් හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය මට්ටමකින් ඉහල දැමීම. | 4.4.1 කුසලතාවයේ අකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහණයේ ප්‍රමාණය | වාර්ෂිකව බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | √ අයදුම් කළ සංඛ්‍යාවෙන් 65 % කට වඩා වැඩි ප්‍රමාණයක් බඳවා ගෙන ඇත. | |
| | 4.ඇ: 2030 වන විට අන්තර්ජාතික සහයෝගය තුළින් විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ගුණාත්මක වශයෙන් ඉහළ ගුරුවරුන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම. | 4.ඇ1 අදාළ රටෙහි එක් එක් මට්ටම සඳහා ඉගැන්වීම සඳහා අවභ්‍ය වන පූර්ව සේවාස්ථ හෝ සේවාස්ථ (අ) පූර්ව ප්‍රාථමික, (ආ) ප්‍රාථමික , (ඇ) පහල ද්විතියික , සහ (ඈ) ඉහල ද්විතියික අධ්‍යාපනය යන අංශයන්හි අවම සංවිධානාත්ම පුහුණුව හෝ ලබා ඇති ගුරුවරුන් ප්‍රමාණය. | ධාරිතාව ගොඩනැගීම සඳහා පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය | √ | | |
| | 4.5: 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතා ඉවත් කර සමාන ප්‍රවේශයක් ලබා දීම. සමාජයේ සියළු මට්ටම් සහිත පුද්ගලයන්ට අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව ලබා දීම (ආබාධිතයන්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි තත්වයන් වල සිටින ළමුන්) | 4.5.1 සියලු අධ්‍යාපනික දර්ශක සඳහා වන සමානාත්මතා දර්ශක වෙන්කොට දැක්විය හැකිය (ස්ත්‍රී/පුරුෂ, ග්‍රාමීය/නාගරික, ධනවත්භාවයේ මට්ටම යන පංචමකය සහ ආබාධිත මට්ටම, ස්වදේශීක ජනයා සහ ගැටුම් බලපෑම ආදී දත්ත පවත්නා බව අනුව) | වෘත්තීය පාඨමාලා බඳවා ගැනීම සඳහා සමාන අවස්ථා ලබා දීම ආබාධිත සිසුන් සඳහා පහසුකම් සහිත විද්‍යාල සංඛ්‍යාව ආර්ථික වශයෙන් සෞඛ්‍ය සම්පන්න නොවන පවුල් සඳහා ශිෂ්‍ය දීමනා සහ ශිෂ්‍යාධාර සංඛ්‍යාව | | √ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

**ජයග්‍රහණ**

- ශිෂ්‍ය බඳවාගැනීම් වැඩි කිරීම සඳහා 2025 අයවැයයෙන් වෙන්වූ ප්‍රතිපාදන මගින් විද්‍යාල වල වැඩහල් පහසුකම් හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට යොදා ගැනීම.

- පවතින ආර්ථික අර්බුදය හමුවේ වියදම් කලමණාකරණය කර ගැනීම සඳහා මාර්ගගත මෙන්ම භෞතිකව (මිශ්‍රව) පාඨමාලා පැවැත්වීම හා සහනදායි අයකිරීම් මත විශේෂ පාඨමාලා හැදෑරීමට වයස් සීමා නොසලකමින් අවස්ථා පුළුල් කිරීම

- නිපුණතා සහිත ශ්‍රමිකයන් සඳහා RPL සහතික ලබාගැනීමේ අවස්ථා සියළු විද්‍යාල හරහා ලබා දීම හා පෞද්ගලික අංශයේ ශ්‍රමිකයන් සඳහාද අවස්ථා සලසා දීම.

- හඳුනාගත් කර්මාන්ත පාඨමාලා සඳහා නිපුණතා සිසු සවිය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ලබා දීම සහ ශිෂ්‍ය සුභසාධන පහසුකම් ලෙස සහනදායි වාර ප්‍රවේශපත්‍ර ලබා දීමට හැකි වීම.

- විදේශීය මූල්‍ය පාර්ශවකරුවන්ගේ (කොරියානු රජය, GIZ) සහයෝගය ලබාගෙන පාඨමාලා නවීකරණය කිරීමට හැකිවීම.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තෝරාගත් පාඨමාලා සඳහා ඉගැනුම් මාර්ගෝපදේශ සකස් කිරීම,වැඩහල් යාවත්කාලීන කිරීම සහ රැකියාගත පුහුණු ක්‍රියාවලිය නිසි අයුරින් සිදු කිරීම සඳහා පුහුණු උපායමාර්ග සකස් කිරීම.

- හෝටල් ක්ෂේත්‍රයට අදාල පාඨමාලා ආරම්භ කිරීම හා පුළුල් කිරීම සඳහා පෞද්ගලික ආයතන සමඟ එකාබද්ධ අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම තුලින් පාඨමාලා ආරම්භ කිරීම

- Green TVET සංකල්ප ක්‍රියාත්මක ක්‍රියාත්මක කිරීම සඳහා පාඨමාලා හඳුන්වා දීම හා පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කිරීමට හැකිවීම.

**අභියෝග**

- සමාජීය ආකල්ප හේතුවෙන් වෙල්ඩින්,පෙදරේරු , ලී වැඩ වැනි කර්මාන්ත පාඨමාලා සඳහා සිසුන්ගේ අඩු ආකර්ෂණයක් පැවතීම.

- වෘත්තීය පාඨමාලා සඳහා කාන්තා සිසුන්ගේ සහභාගීත්වය සාපේක්ෂව අඩුවීම.

- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා අවශ්‍ය වන සහිත යටිතල පහසුම් සහ විශේෂිත පුහුණු පාඨමාලා අවම වීම.

- වෘත්තීය අධ්‍යාපන අංශයේ හඳුනාගත් අංශවල පුරප්පාඩු පිරවීම දීර්ඝ කාලීනව සිදුනොවීම හේතුවෙන් වෘත්තීය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට බලපෑමක් ඇති වීම.

- නවීන තාක්ෂණය මෙන්ම කාර්මික  අංශයට අදාළ නව තාක්ෂණට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය යාවත්කාලීන නොවීම හා වෘත්තීය අධ්‍යාපනය ධාරිතා වර්ධනය සඳහා විධිමත් පුහුණු ආයතනයක් නොමැති වීම.

- වෘත්තීය පුහුණු ලාභීන්ගේ රැකියාගත තොරතුරු නිශ්චිත ලෙස ග්‍රහණය කර ගැනීමට පහසු ක්‍රමවේදයක් නොමැති වීම.

- දැනුම පලපුරුද්ද හා කුසලතා සහිත  වෘත්තිකයන් රට හැරයාම හේතුවෙන් (බුද්ධිගලනය ) ක්ෂේත්‍රයේ පළපුරුදු වෘත්තිකයන් අවම වීම.

- දේශීය කර්මාන්ත ක්ෂේත්‍ර ස්ථාවර ලෙස වර්ධනය වී නොමැතිවීම තුල තාක්ෂණික දැනුම හුවමාරුට සීමා ඇතිවීම.

6 වන පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යාව කළමනාකරණය

| වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජේෂ්ඨ | 1293 | 486 | 807 |
| තෘතීයික | 144 | 61 | 83 |
| ද්විතීක මට්ටම | 1285 | 868 | 417 |
| ප්‍රාථමික | 1175 | 704 | 471 |
| **එකතුව** | **3897** | **2119** | **1778** |

### 6.1.1 2025.12.31 දිනට සේවක පුරප්පාඩු

| වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| අධ්‍යයන | 1473 | 505 | 968 |
| අනධ්‍යයන | 2424 | 1614 | 810 |
| **එකතුව** | **3897** | **2119** | **1778** |

### 6.1.2 කාර්යසාධනය මත අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වල බලපෑම

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 50 % ඉක්මවා ඇති අතර මේ වන විට බාහිර උපදේශකවරුන්ද යොදා ගනිමින් පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. එසේ වුවදල පවතින ගෙවීම් රේටයන්ට අනුව පලපුරුදු හා සුදුසුකම් ලත් බාහිර උපදේශකවරුන් බඳවා ගැනීම බොහෝ විද්‍යාලවලට ගැටළුකාරී වී ඇත. එබැවින්, කාර්මික අධ්‍යාපනය හා පුහුණුව තුලින් වඩාත් වෘත්තීය රැකියා අවස්ථා වෙත යොමු කළ හැකි පාඨමාලාවලට අදාළ වන ශිල්ප ප්‍රදර්ශක තනතුරු 115 හා ක් උපදේශක තනතුරු 200 ක් පිරවීම ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇති අතර, නව බඳවා ගැනීම් සඳහා අනුමැතිය ඉදිරිපත් කර ඇත. නව බඳවා ගැනීම් සිදු කිරීම් තුලින් වඩාත් යාවත්කාලීන දැනුම හා ආකල්ප සහිත පුහුණු කරුවන්ගේ සේවය ලබා ගැනීම තුලින් කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයේ ගුණාත්මකතාවය ඉහල නැංවීමට සෘජු බලපෑමක් ඇති කර ගත හැක.

## 6.2 මානව සම්පත් සංවර්ධන කාර්යසාධනය

**2025 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්**

| # | වැඩසටහන | පුහුණුව ලැබූ කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | වැඩසටහන් ස්වභාවය (දේශීය/ විදේශීය) | | අයෝජනය (රු) | ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 1 | ලියැ‍ං ජියා හේ - 2025 ජනවාරි මාසයේ නව යුගයේ චීන සහයෝගිතා පුහුණු වැඩසටහන | 01 | 2025.01.10-2025.01.20 | | විදේශීය | 113,963.93 | ගෝලීය තක්ෂණය හඳුනා ගැනීම සහ දැනුම හුවමාරුව තුලින් සහයෝගීතා වර්ධනය |
| 2 | සියලුම අතිරේක අධ්‍යක්ෂවරුන් / උප විදුහල්පතිවරුන් සහ ප්‍රධානීන් සඳහා පුහුණු වැඩසටහන | 100 | 2025.03.18 | දේශීය | | 78,305.00 | කළමණාකරණ මට්ටමේ නිළධාරීන්ගේ ධාරිතා වර්ධනය |
| 3 | CoTs සහ TCs හි අධ්‍යක්ෂවරුන් / විදුහල්පතිවරුන් සහ උප විදුහල්පතිවරුන් සඳහා ERPL පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන | 40 | 2025.05.22 | දේශීය | | 32,000.00 | කළමණාකරණ මට්ටමේ නිළධාරීන්ගේ ධාරිතා වර්ධනය |
| 4 | උපදේශකයින් සඳහා දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 05 | 2025.03.24-2025.03.27 | දේශීය | | 24,000.00 | ව්‍යාත්තීය දැනුම වැඩිදියුණු කිරීම |
| 5 | විදුලි තාක්ෂණය සම්බන්ද කර්මාන්ත පිළිබඳව පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | 22 | 2025.04.01-2025.04.13 | දේශීය | | 2,014,840.00 | ව්‍යාත්තීය දැනුම වැඩිදියුණු කිරීම |
| 6 | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් "තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත" පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 2025.05.22 | දේශීය | | | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත පිළිබඳ දැනුම වර්ධනය |
| 7 | ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ සහ පිළිතුරු පත්‍ර ඇගයීමේ ක්‍රම යාවත්කාලීන කිරීමේ වැඩසටහන | 65 | 2025.06.01-2025.06.14 | දේශීය | | 198,800.00 | දැනුම යාවත්කාලීන කිරීම කිරීම තුලින් ප්‍රශස්ථ මට්ටමේ විභාග පැවැත්වීම |

| # | වැඩසටහන | පුහුණුව ලැබූ කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව | වැඩසටහන් කාල සීමාව | වැඩසටහන් ස්වභාවය (දේශීය/ විදේශීය) | | අයෝජනය (රු) | ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 8 | නවීන GNSS සමීක්ෂණ යෙදුම් වැඩසටහන හඳුන්වාදීම | 42 | 2025.06.20 | දේශීය | | 30,760.00 | අධ්‍යයන අනධ්‍යන කාර්ය මණ්ඩල වල නවීන තාක්ෂණ දැනුම වර්ධනය |
| 9 | TVET හි ඩිජිටල්කරණය සහ AI පිළිබඳ පුහුණු වැඩසටහන | 18 | 2025.07.21 | දේශීය | | | අධ්‍යයන අනධ්‍යන කාර්ය මණ්ඩල වල නවීන තාක්ෂණ දැනුම වර්ධනය |
| 10 | නවීන GNSS සමීක්ෂණ යෙදුම් වැඩසටහන හඳුන්වාදීම | 32 | 2025.07.22 | දේශීය | | 31,385.00 | අධ්‍යයන අනධ්‍යන කාර්ය මණ්ඩල වල නවීන තාක්ෂණ දැනුම වර්ධනය |
| 11 | ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 75 | 2025.08.12 | දේශීය | | 30,842.50 | කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය තුලින් ගුණාත්මක සේවාවක් ලබා ගැනීම |
| 12 | ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 120 | 2025.08.14 | දේශීය | | 16,010.00 | කාර්ය මණ්ඩලයේ නිලධාරීන් අභ්‍යන්තර කටයුතු පිළිබඳ දැනුම ලබා දීම |
| 13 | නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ වැඩසටහන | 135 | 2025.09.03 | දේශීය | | 140,866.00 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබා දීම තුලින් ප්‍රස්මපාද ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම |
| 14 | ශාස්ත්‍රපති පාඨමාලා සඳහා ගෙවීම් කිරීම | | | දේශීය | | | කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන්ගේ අධ්‍යාපන සුදුසුකම් වර්ධනය. |

7 වන පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය අනුකූලවේ/අනුනකූල (නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත්කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ. | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් “ බී” ගිණුම. | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම්. | අදාළ නොවේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම්. | අනුකූල වේ. | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ. | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 267/2018ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන පඩිනඩි / කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ(CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 2.6 | වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.9 | භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය( GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **3.** | **මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ.135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.4 | අංක 2014.05.11 දරණ 171/2004 ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී එය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ. | | |
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| **6.** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු .රේ . 134 (2)DMA – 1/2019 අනුව වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත. | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | | |
| 6.3 | අංක 40 (4) හි 2018දරණ පනතේ උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 6.4 | මු.රෙ.134 (3) ට අනුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA 1-2019 චක්‍රලේඛය අනුව වර්ෂය තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පවත්වා තිබීම. | අනුකූල වේ. | | . |

| | | | | |
|---|---|---|---|---|
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 2017/01 හි 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ලේඛනය ප්‍රකාරව එහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සුදුසු නිලධාරියෙකු පත්කර ඒ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම. | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 ට අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ අදාළ කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ. | | |
| 8.5 | භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.177 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගනකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 6 ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109,110.ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| 9.5 | අංක 2016/30 දරණ 2016.12.29 දිනැති ලේඛනයේ 3.1 පරිච්ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාව සම්පූර්ණ වාහනවල ලොග් පොත්වල අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ. | | |
| **10.** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා , විගණනය සඳහා ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ.94 (1) ප්‍රකාරව උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | | |
| **12.** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟ ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | | නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත. |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග සැසඳීම. | අනුකූල වේ. | | |
| **15.** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම. | අනුකූල වේ. | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | අංක 2017.09.20 හා 04/2017 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ඒ තුළින් මහජනයාගේ ප්‍රශංසා හා චෝදනා පල කිරීමටද පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 8 හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වතාවක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අංක 05/2018 (1) අනුව පුරවැසි ප්‍රඥප්තියක් සේවාලාභීන්ට සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව සේවාලාභී පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම් කටයුතු හා ක්‍රියාත්මක කිරීම / ඇගයීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදයක් ආයතනය විසින්ම සකස්කොට තිබීම. | අනුකූල වේ. | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | රාජ්‍ය පරිපාලන අංක 2018/02 හා 2018.01.24 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර තැබීම. | අනුකූල වේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම. | අනුකූල වේ. | | |
| **20.** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත්කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | | |